*2016 ජූලි මස 26 බ්‍රහස්පතින්දා දින*
*2016 ஜூலை மாதம் 26 ஆம் திகதி செவ்வாய்க்கிழமை*
*Tuesday 26 th July 2016*

ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ பிரதித் தவிசாளர் - உதயகாந்த குணதிலக அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.D.Chairman Udayakantha Gunathilaka preside the Chair

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

සියළු දෙනාටම සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා. සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා ,ඒවගේම අමාත්‍යතුමන්ලා ඒවගේම ආණ්ඩු පක්ෂයේ ගරු සභානායකතුමා,ගරු ආන්ඩු පක්ෂ සංවිධායකතුමා විපක්ෂනායකතුමා,ඒවගේම විපක්ෂයේ ගරු සංවිධායකතුමා ගරු මන්ත්‍රීතුමන්ලා , ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. 2016 ජූලි මස 26 වෙනි අඟහරුවාදා දින අද දින ආරම්භ කරන ලද සභා රැස්වීමේ න්‍යාය පත්‍රානුකූලව කටයුතු ආරම්භ කිරීම සඳහා සියළු දෙනාගේම සහයෝගයත් අපේක්ෂා කරනවා. මුලින්ම,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්දීම්:**

මේ යටතේ කිසිවක් නැත.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

මේ යටතේ කිසිවක් නැත.

**ගරු සභාපතිතුමාගේ නිවේදන:**

මේ යටතේ කිසිවක් නොමැත.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා:**

***ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය***
***கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய***
*Hon.Gov.Whip Harsha Siyambalapitiya*

---

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ජී.ඇම්.කරුණාපාල ගරු මන්ත්‍රීතුමා දීපාල් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලා තිබෙනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

---

එම නිවාඩු ලබාදීම සුදුසු යැයි යෝජනා කරනවා.

**ලිපිලේඛණ පිළිගැන්වීම :**

මේ යටතේ සබරගමුව පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය - 820 දරණ පළාත් මාර්ග සංවර්ධන,ග්‍රාමීය යටිතල පහසුකම්,සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - තෙවන කාණ්ඩය- 2015 වර්ෂය යන විගණකාධිපති වාර්තාව සභාගත කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගේ මේසය මත මේ වෙන කොට ලැබිලා තිබෙනවා.

අනිත් යෝජනාව සබරගමුව පළත් සභාවේ විසර්ජන ශීර්ෂය - 830 දරන සමාජ සුභ සාධන,පරිවාස හා ළමා රක්ෂක,ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - හතරවන කාණ්ඩය - 2015 වර්ෂය යන විගණකාධිපති වාර්තාව හා සබරගමු පළාත් සභාවේ විසර්ජන ශීර්ෂය - 840 දරන පළාත් අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ පළාත් දෙපාර්තමේන්තු පිළිබඳව විස්තරාත්මක විගණකාධිපති වාර්තාව - පස්වන කාණ්ඩය - 2015 වර්ෂය යන විගණකාධිපති වාර්තාව සභාගත කරන බැවින් එම වාර්තා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන බැවින් එහි පිටපත් මේසය මත තබා තිබෙනවා.

මීළගට ගරු මන්ත්‍රී ආරියවංශ බාලසූරිය මැතිතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද ඇඹිලිපිටිය ගොඩකවෙල පුස්සැල්පිටිය හරහා දොරපනේ මාර්ගය අබලන්වීම පිළිබඳව ලිපිය සඳහා පිළිතුරු එවා ඇති අතර එම ලිපි සභාගත කරනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :**

මේ යටතේ කිසිවක් නොමැත.

**පෙත්සම්:**

මේ යටතේ ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් මැතිතුමාගේ පෙත්සම ඉදිරිපත් කිරීමට අවස්ථාව.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
**கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்**
*Hon.Member M.Y.M.Iflar*

---

ගරු සභාපතිතුමනි අංක 14,ගුරුගේවත්ත,මාවුදැල්ල ,දැල පදිංචි එම්.එල්.ඩී.එස්.ලේකම්ගේ මහතා විසින් ඉදිරිපත් කළ පෙත්සම මේ සමග ඉදිරිපත් කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
**கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக**
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

එම පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනවා.

**ප්‍රශ්න:**

මේ යටතේ කිසිවක් නොමැත.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ:**

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි පුංචි අවස්ථාවක් ගන්නවා. මේක අමාත්‍යරුන්ගේ විතරක් නෙමෙයි සියළු මැති ඇමතිවරුන්ගේ කාරණාවක් විදිහට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මෙතන ඉන්න අපි කවුරුවත් මන්ත්‍රීවරු ඇමතිවරු මේ වාහන පිළිබඳ කවුරුවත් හිතා මතා අනතුරකට ලක් කරන්නේ නෑ. නමුත් අපිට ඉතිහාසයේ මතකයක් තියෙනවා. මෙවැනි අවස්ථාවලදී රක්ෂණ සමාගම මේ සෞඛ්‍ය වෙන්න පුළුවන් වාහන වෙන්න පුළුවන් මේ ආයතන ඇතුළේ තියෙන දේවල් වෙන්න පුළුවන් මේ සියල්ල ගත්තහම ඒ අදාල වාර්තා නියමාකාරයෙන් පොලීසිය රක්ෂණ සමාගම ඒ සියල්ල ගත්තහම ඔවුන් ඒ කාර්යය භාරය යුහුසුළුව කළා. මම කණගාටු වෙනවා රාජ්‍ය ආයතනයක් හැටියට අද රත්නපුරේ රක්ෂණ සමාගම විශේෂයෙන් මෙකේ බලධාරියා අපේ ළඟම හිතවතෙක්. නමුත් ඒ හිතවත්කම නෙමෙයි මෙතන තියෙන්නේ. දැන් දින 14 කට පමණ පෙර මගේ නිවස ගාව තිබුණ නවත්තලා නිවසට දාන්න හදපු වාහනය තමයි හැප්පුවේ. ඒ හප්පලා ඒ අවශ්‍ය කරන පොලිස් වාර්තා ඒ සියල්ල දීලා අද වෙන කොට දවස් 14 ක් ඒ ටොයෝටා ආයතනය නමුත් අද වෙනකන් ඒ නිළධාරීන් අපිට පවා බොරුව කළා. මේ අවශ්‍ය කරන දේ පිළිබඳව. ඒ නිසා මම යෝජනාවක් කරනවා මේ සියල්ල කතා බහ කරලා මේ පෙර මේ සභාවට මේ පළාත් සභාවට ගෞරවයක් ඇති වෙන ආකාරයට යම් කටයුත්තක් සේවාදායකයෙක් හැටියට ඉටු කරලා තියෙනවා නම් අන්න ඒ ආයතනයට මේ රක්ෂණ සියල්ල කැබිනට් එක හැටියට අපි සියළු දෙනා මන්ත්‍රීවරු විදිහට මම යෝජනාවක් කරනවා පුද්ගලයෙක් හැටියට ටයි එකක් දාගෙන හිටියාට වැදගත්කමක් වෙන්නේ නෑ. ඒ අපේ යාළුවෙක් වෙන්න පුළුවන් කළමණාකාරතුමා. නමුත් ඊට වඩා ප්‍රායෝගික වෙන්නේ මම මේ කතා කරන්නේ ශ්‍රීලංකා රක්ෂණ සමාගම ගැන නෙමෙයි. රත්නපුර ආසනයේ ඉන්න ප්‍රධාන කළමණාකරුවා. ඒ නිසා අනිත් සියළු දෙනාගේ සියළු සහයෝගය ලැබුණා නමුත් ඉෆ්ලාර් මන්ත්‍රීතුමා දන්නවා මගේ අතිශය පෞද්ගලික හිතවතෙක්. නමුත් පෞද්ගලිකත්වය නෙමෙයි මෙතන තියෙන්නේ අපිට. ඒ නිසා ඒ නිළධාරීන්ට මෙතන මේ ආයතනය පිළිබඳව කතා කිරීමට ප්‍රශ්යක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඔවුන්ගේ පුටුවටවීම කාර්යය භාරයට වෙනුවෙන් කරන කාර්යය භාරයක් වෙන්නට පුළුවන්. මම යෝජනාවක් කරනවා මේ ඉතිහාසයේදී සලකා බැලීමේදී යම් සේවාදායකයෙක් සතුටු වෙන අන්දමට කටයුතු කරලා තියෙනවා නම් යම් ආයතනයකට රක්ෂණ සියල්ල පවරන්න කියලා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-----------------------------------------------------

බොහොම ස්තූතිවන්ත වෙනවා ගරු අමාත්‍යතුමනි . ඒ කාරණාව සත්‍ය කාරණාවක් හැටියට මම දකිනවා. මොකද මගේ වාහනය අනතුරට පත් වෙලා දැන් ටොයෝටා ආයතනයේ හදලා මාසයකට වැඩියි. තාම රක්ෂණ සමාගමින් චෙක්පත යවන්නේ නෑ සියළු කාරණා නීත්‍යානුකූල වෙලා තියෙනවා. නමුත් චෙක්පත යවන්නේ නෑ. ටොයෝටා සමාගමින් රක්ෂණ සමාගමින්. ලොකු අපහසුතාවට අපි සියළු දෙනාම පත් වෙලා තියෙනවා මේ මෑත කාලයේ ඒ

රක්ෂණ සමාගමත් එක්ක කටයුතු කිරීමේදී.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

ගරු සභාපතිතුමනි පහුගිය කාලයේ හිටපු රක්ෂණ නියෝජිතයා ඇයි අයින් කරන්න හේතුව. මේ පුද්ගලයා හරියට වැඩ කළා. ඇරත් අපි කවුරු හරි රෝහල්ගත කළා නම් අපි දන්නේත් නෑ. අපිට ඉස්සෙල්ලා එයා ගිහිල්ලා. මේවගේ හරි කාර්යය භාරයක් කළා ඒ පුද්ගලයා. ඒ පුද්ගලයාගෙන් වෙනත් කෙනෙකුට පැවරීම කාගේ වුවමනාවට කළාද මං දන්නේ නෑ කියන්න. නමුත් මේ උඩ අපි අපහසුතාවයට පත් කළා ගරු ප්‍රධාන ඇමතිතුමනි. ඒ නිසා පහුගිය අපිට රක්ෂණය හඳුනා දුන්න පුද්ගලයාටම නැවත මේ රක්ෂණය භාර දීම ඉතා වැදගත් වෙනවා ගරු සභාපතිතුමනි.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
------------------------------------------

ගරු සභාපතිතුමනි මේ කාරණාව ප්‍රධාන ලේකම්තුමාගේ විෂයපතයට ඇතුළත් දෙයක්. මට මතක තියෙන විදිහට රක්ෂණ නියෝජිතයෙක් මගින් මේ ගරු පළාත් සභාවේ විශාල ප්‍රමාණයක් රක්ෂණය වෙන අතර, නියෝජිතයෙකුට ගිය කොමිෂ් ප්‍රමාණය සම්පූර්ණයෙන් පළාත් සභාවට ලැබෙන සේ සකස් කරලා සෘජුවම පළාත් සභාවෙන් රක්ෂණයවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වුණ නිසා මේ රක්ෂණ නියෝජිතත්වය නැති වුණා කියන එක වගේ මට මතකයක් තියෙනවා. මම මේ සම්බන්ධයෙන් විශේෂයෙන් ගරු අතුල ඇමතිතුමාගේත් සිරිපාල කිරිඇල්ල අපේ ගරු සංවිධායකතුමාගේත් විපක්ෂයේ ඉල්ලීම අනුව එන සභාවට මේ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු මට දෙන්නට පුළුවන්. ගරු සභාපතිතුමනි විශාල කොමිෂ් මුදලක් මේ සභාවට ඉතිරි කිරීමේ පදනම මත මේ මේ දේ සිද්ධ වුණා වගේ මට ප්‍රධාන ලේකම්තුමා පැහැදිලි කළා වගේ මතකයේ තියෙන්නේ. ඒ නිසා එන සභා වාරයට පැහැදිලි විස්තරයක් අපි ලබා දෙන්නම්.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
----------------------------------------------------------------------------------------

ඒක ප්‍රධාන ලේකම්තුමා දැනුවත් කරලා මෙවැනි අපහසුතාවට පත් නොවෙන විදිහට කටයුතු කිරීමට සාකච්ඡා කරලා වැඩ පිළිවෙලක් සැදීමට අවශ්‍යයි කියලා යෝජනා කරනවා.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම්:**

***ගරු මන්ත්‍රී අජිත්*** *ශාමින්ද*
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*
------------------------------------------------------

සභාවේ නොමැත.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*
--------------------------------------------------------

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පෙත්සමක් ඉදිරිපත් කිරීමට තමයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අභියාචනායක් ඉදිරිපත් කරනවා චමිලා මෙනවිය. එතුමියගේ මාරුවීමක් සම්බන්ධව. මම එය සභාගත කරනවා. ස්තුතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

එය සභාගත කරනවා. ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි මගේ ප්‍රශ්නය අතුල කුමාර රාහුබද්ධ ගරු ඇමතිතුමා සම්බන්ධව. ගල්පුස්සැල්ල ඇස්ගලහේන පාරක් කොන්ක්‍රීට් කිරීම ලක්ෂ දහයයි. ගරු සභාපතිතුමනි මෙතුමාට මට දීලා තියෙන තොරතුරු මම සෑහීමට පත් වෙන්නේ නෑ. ගරු ඇමතිතුමා කියාපු ආකාරයට පාරේ පිපිරුම හා සමානවම පේන්නේදෙවෙනි පාර කොන්ක්‍රීට් එක දාපුවහම කියලයි එතුමාගේ පිළිතුර වෙලා තියෙන්නේ. ඒක මම පිළිගන්නේ නෑ ගරු සභාපතිතුමනි. මේකේ මම දූරකථනයෙන් ගත්ත ෆෝටෝ තුනක් තියෙනවා. මේක හරිද වැරදිද කියලා බැලීමට මේක ඔබතුමාට එවනවා. මේකේ පිපිරුම තමයි මේ තියෙන්නේ. මේකේ එහා කෙළවරේ ඉදන් මෙහා කෙළවරට මම ගියා. මේක මගේ පුරුද්දක් වශයෙන් තියෙනවා ගරු සභාපතිතුමනි පාරවල් හදන කොට මේ කැඩෙන බිඳෙන ඒවා හම මාසෙන් අට මාසෙන් අවුරුද්දෙන් මේවා විනාශ වෙන කොට මේවා සොයා බැලීම මම නිරායාසයෙන් රොබෝ කෙනෙක් වගේ යනවා. ඒ යන අවස්ථාවේ තමයි මේ දස ලක්ෂයේ පාර මට හමු වුණේ. එතෙන්දී මට සමහර විට ලේකම්තුමා කියපු නිසා වෙන්න ඇති වෙලා තියෙන්නේ. ගරු ඇමතිතුමා ඔබතුමා අපහසුතාවයට පත් වෙන්න නෙමෙයි. නමුත් මේක පුපුරමක් විදිහට තමයි මේ පිපිරුම් තුනම දකින්නේ ගරු සභාපතිතුමනි. පිපිරුමක් තියෙන්නේ. ඒ නිසා මම සෑහීමට පත් වෙන්නේ නෑ. මේ මුදල් ගසා ගෙන කෑම නවත්තන්න ඕනේ. මේවා පහුගිය කාලයේ නවත්තන්න බැරි නිසා මම 2004 මගේ වාහන බලපත්‍රය ලක්ෂ හතළිස් තුන හමාරට විකුණලා ටොපියක්වත් කෑවේ නෑ. ඒ සල්ලි වියදම් කලේ සබරගමු පළාතේ පාරවල් 19 ක් කරන්න. මම ඒ අඩි 190, 200 දෙසීයේ පාරවල්. දැන් අවුරුදු පහළොවක් වෙලා ගරු සභාපතිතුමනි මේ ගලක් ගැලවිලා නෑ මේ පාරවල්වල. මේක ආදර්ශයක් දුන්නා මුළු රටටම. දැන් මේ වකවානුවේත් මේ ලක්ෂ දහයක් පමණ වියදම් කරලා හදපු පාරේ පාර පුපුරලා තියෙන වෙලාවේ මේ ගැන ප්‍රශ්න කරන විට මේක කොන්ක්‍රීට් එක බට් කිරීමේදී වුණ දෙයක් කියලා කියනවා නම් ඒක මට පිළිගන්න බෑ ගරු සභාපතිතුමනි. මේ ෆොටෝ තියෙනවා. මම එවනවා ඔබතුමාට මා අතරටම නැවත ලබා දෙන්න කියලා ඉල්ලනවා ගරු සභාපතිතුමනි.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

---

ඔබතුමා ප්‍රශ්න ගණනාවක් අහලා තිබුණා. වාචිකවත් ලිඛිතවත් ලබා

දුන්නා. ඇහැලියගොඩ,කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරකඩුව ගල්පුස්සැල්ලාව ඇස්ගලහේන පාර මේ තියෙන්නේ මේ කාර්මික නිළධාරීන් ලබාදීපු දේවල්. එතුමා කියනවා අපිටවත් එහෙම නැත්නම් මේ කතා කරන මටවත් ඒ පිළිබඳව දැනීමක් නෑ. නිළධාරීන්ගේ නිගමනය තමයි අදාල කරන මේ ඉර කොන්ක්‍රීට් එක වතාවක් කරලා දෙවෙනි වතාවේ බද්ධ කිරීමට යන පැලීම පිළිබඳව ඔබතුමා සෑහීමට පත් නොවන්නේ නම් අපි ඒ පිළිබඳව එකඟ වෙනවා. ඒ සඳහා ඔබතුමාට අපි මාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකතුමිය සමග දිනයක් ලබා දෙනවා අදාල කාර්මික නිළධාරී මහත්තුරුන් සමඟ ගිහිල්ලා පරීක්ෂණයක් ඔබතුමාත් ගිහිල්ලා සහභාගි වෙනවා නම් වඩාත් හොඳයි. ඔබතුමාට පහසු කැමති වෙලාවක් ලබා දෙන්න සූදානම්.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි මේක මාපියාවක් වෙලා තියෙනවා අපිට මේක සබරගමු පළාතට කොන්ත්‍රාත්කරුවෝ නැති වෙනවා. මේවා කරන්න ගියොත් මන්ත්‍රීවරුන්ට මේවා නැති වෙනවා. කොන්ත්‍රාත්කරුවෙක් ඕනේ කරන්න. පහුගිය කාලයේ ආර්ඩීඒ එක හරහා දුන්නු පාරවල් ගරු සභාපතිතුමනි රුපියල් තිස් හත්දාහක් අඩුවෙන් දාලා තියෙනවා. දැන් ලක්ෂ හතරට ගත්ත කොන්ත්‍රාත් එකෙන් තිස් හත්දාහක් අඩු වෙන කොට රැඳවුම් ගාස්තු වෙනම අඩු කරන කොට රුපියල් අසූ දාහක් විතර අඩු වෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. පාර ප්‍රමිතියට තියෙනවාද කියලා බලන්න ඉංජිනේරු මහත්තයා ගිහිල්ලා දෙපොළකින් කෑලි දෙකක් කඩලා තියෙනවා. ඒ කපාපු එකට අය කරන දහ දාහත් කොන්ත්‍රාත්කරුවාට කරලා තියෙනවා. මේ විදිහට දැන් කොන්ත්‍රාත්කරුවෝ නැති වෙනවා මේ සබරගමු පළාතේ. මේක ලොකු ප්‍රශ්නයක්. දැන් මේ කෑලි දෙකක් කපා ගෙන යන කොට ඒක පළාත සභාවට හෝ රජයට දරන්න බැරි නම් ඒක අහිංසක කොන්ත්‍රාත්කරුවාගෙන් දහ දාහක් අය කරනවා නම් මේක අපි කාටද කියන්නේ. මේ ගැන තමුන්නාන්සේ විශේෂයෙන් අවධානය යොමු කරන්න. කොන්ත්‍රාත්කරුවෝ නැති වෙයි. අපිට වැඩ කර ගන්න. ඒවගේ අසාධාරණකම් කරන්න ගියොත්. ආර්ඩීඒ එක හරහා දුන්නු පාරවල් විශාල වශයෙන් අසාධාරණයක් වෙලා තියෙනවා. මේ කොන්ත්‍රතාත්කරුවන්ට දීලා තියෙන මුදල් වලින් හතරෙන් එකක් කපලා තියෙනවා. මම මේක ඔබතුමාගේ අධීක්ෂණයට ලක් කරනවා. ලක් කරලා මට ආපහු එවන්න.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

-----------------------------------------------------

මේක ආර්ඩීඒ එකේ වෙන්න පුළුවන් පළාත් සභාවේ වෙන්න පුළුවන් . 15% ලාභාංශ හදලා තමයි ගෙවන්නේ. මෙවැනි ප්‍රශ්නයක් ආවහම අපේ නිළධාරීන්ට. මන්ත්‍රීතුමාවවත් මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරයාවත් පළාත් සභාවේ ඇමතිවරයාවත් මේකේ තාක්ෂණය දන්නේ නෑ. නමුත් මේකට අවශ්‍ය ලාභාංශ හා රැඳවුම් වැඩක් හරියට නොකළොත් මම යෝජනා කරන්නේ ඇමතිවරයා හැටියට මොන කොන්ත්‍රාත්කාරයා නැති වුණත් හරියට කරන කොන්ත්‍රාත්කාරයාගෙන් ඒකට අවශ්‍ය කරන දේ අය කරන්නම ඕනේ. කොන්ත්‍රාත්කාරයෝ නැති වෙන්නේ නෑ, කොන්ත්‍රාත්කාරයෝ හැදෙයි. හැබැයි අපි කතා කරන්නේ හරියට කරන

කොන්ත්‍රාත්කාරයෝ හදා ගන්න නම් ඒ හදා ගන්න දේදී ඒක හරියට නැත්නම් බුස් කටර් එකෙන් ගන්න එක. ඒ තත්ත්ව පරීක්ෂණ කැල්ල. ඒක නියම ප්‍රමිතියෙන් කරලා නෑ. නියම ප්‍රමිතියෙන් හදලා නැත්නම් ඒක සල්ලි ගෙවන්න පුළුවන්කමක් නෑ ඒ වාර්තාවට. අපිට තියෙන්නේ ඒ දෙක කරන්න. ඒ නිසා මම යෝජනා කරන්නේ පුද්ගලයා අදලා නෑ . කොන්ත්‍රාත්කාරයා අදාල නෑ. සමාගම අදාල නෑ. ආර්ඩීඒ එකේත් ඒක කෙරෙනවා නම් පළාත් සභාව හැටියට අපි කියන්නේ කොන්ත්‍රාත්කාරයෙක් ගෙන්මයි අය කර ගන්න ඕනේ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---------------------------------------------------------

තවත් මේ ගැන කතා කරනවාද. ගරු ඇමතිතුමා එතකොට ලක්ෂයක කොන්ත්‍රාත් එකක් ගන්නවා. මේ අයගෙන් 5% අය කරනවා. එතකොට 95 යි. මේ 95 න් දහ දාහක් අයින් කරන්න යනවා නම් තමුන්නාන්සේලා වෙක් කරන එකට ඒ කෑලි දෙකක් කපන්න. අර මනුස්සයට මොකක්ද මේ කොන්ත්‍රාත් එකෙන්. ඒකෙන් තමයි හොරකම වැඩි වෙන්නේ. එතකොට තමයි නියම ප්‍රමිතියට පාරක් නැති වෙන්නේ.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

---------------------------------------------------------

ලක්ෂයද දස ලක්ෂයද කියන කාරණාව නෙමෙයි. ඔහුට සමිතියකට ගියහම ඒ යන මුදල නවත්තන්න බෑ. රුපියල් දහ දාහට හැදුවත් ඒකේ ලාභාංශයක් තියෙනවා. ඒක තියලා තමයි නිළධාරීන් හදන්නේ. ඒ නිසා ලාභය තියෙනවා නම් වැඩේ හරියට කරන්න ඕනේ. ඔබතුමන්ලා කියනවා නම් මේ වැඩේ හරියට නොකළත් කමක් නෑ කොන්ත්‍රාත්කරුවා රැකෙන්න කියලා ඊළඟට කියනවා මේ වැඩේ කරනවා සමහරවිට මේ කොන්ත්‍රාත්කරුවා හොඳ නෑ කියලා. ඒ නිසා මේක ප්‍රශ්නයක්. මම යෝජනා කරන්නේ ඔබතුමා ඉතාම හොඳ මේ පිළිබඳව හොයා බලන මන්ත්‍රීවරයෙක්. ඒකනේ අපි හැමදාම ඔබතුමාට අවශ්‍ය කරන දේට උදව් කරන්නේ. හැබැයි මේකෙදී ඔබතුමාත් එක්ක එකඟ වෙන්නේත් නෑ අවශ්‍ය කරන දේට සහයෝගය දෙන්නේත් නෑ. ලොකු පොඩි කාරණාවක් නෙමෙයි තියෙන්නේ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයක්. ඒක ලක්ෂය වුණත් ලක්ෂයට අදාල කරන ඇස්තමේන්තුව තුළ ඔහුට ලාභයක් තියෙනවා. ඒක 15% අපි ලාභය හදනවානේ. ඒ වැඩේ හරියට කරහම ලාභය ගන්න පුළුවන්. නමුත් කාර්මික නිළධාරීවරයා එතන ඉන්නවා. ඒ කියන විදිහට දාන්න ඕනේ. ඒ දාන්නේ නැතුව අපේ හිතවත්කම් වලට දාන්න ගියහම තමයි ප්‍රශ්නය තියෙන්නේ. කාර්මික නිළධාරීවරයා දිනයක් දෙනවා ඒක ලක්ෂයද දෙකද විසි දාහද, ලක්ෂ පනහද ඒක ආර්ඩීඒ එකේද, පළාත් සභාවේද, ප්‍රාදේශීය සභාවේද ඒ කියන්නේ නැතුව දාපුවහම ඔය ප්‍රශ්නය එනවා. එතකොට අපේ නිළධාරියෙක් හරියට ඉන්න කොට සිමෙන්ති ටික හරියට වැටෙයි ගල් ටික හරියට වැටෙයි තාර ටික හරියට වැටෙයි. එහෙම නොවුණු තැන්වල තමයි පොඩිද ලොකුද කියන කාරණාව නෙමෙයි මේකේ අපිට ප්‍රමිතිය පිළිබඳ මේකේ හැමදාම ඔබතුමා ගේන්නේ ඉතාම හොඳ පාරක් හැදීමේ අවසාන ප්‍රතිඵලය. හැබැයි ඒක බලන්න මෙහෙම ගියොත් කොන්ත්‍රාත්කාරයෝ ටික රකින්නයි. මාර්ගය හොඳට හදන්නයි මේ දෙක. අපි මැදට එනවා. අපි ඔබතුමා එක්ක එකඟයි. ඒකේ අපි දීලා තියෙනවා. ලක්ෂයද කියන කාරණාව නෙමෙයි. අපි ලක්ෂයක් නැත්නම් සමිතියට පන්දාහක්

දීලා කරනවානේ. දස ලක්ෂය ඊට වඩා වැඩි වෙනවා. ආර්ඩීඒ එක ඊට වඩා වැඩි වෙනවා. මේකෙදී අය කරන එක නෙමෙයි. එහෙම නම් හරි ප්‍රමිතියට නිළධාරීන් ඉස්සරහා දානවා නම් මේක වෙන්නේ නෑ. මේකෙදී කාර්මික නිළධාරී එන්න ඉස්සෙල්ලා දානවා. එතකොට ඔබතුමාගේ හිතවතා කියනවා මෙන්න මෙතන දාලා නෑ අඟල් හතර . එතකොට අපි කැඩුවා. කැඩුවහම සමහර තැන්වල ප්‍රශ්න තිබුණා. අපි හැඳුවානේ. හැබැයි දැනුත් ඒක කරන්න තියෙනවා නම් ඔබතුමා කිව්ව තැන් මම එකග නෑ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------------

අපි දන්නේ නෑ මේක කොන්ත්‍රාත්කාරයාගෙන් අය කිරීම නෙමෙයි. මේක රජයෙන් අය කරන්න ඕනේ. මේක ප්‍රමිතියට තියෙනවද නැද්ද කියලා බලන්න ඕනේ. කාර්මික නිළධාරියාට රජයෙන් ගෙවන්න ඕනේ. පළාත් සභාවෙන් හෝ රජයෙන්. නැත්නම් ඒක කොන්ත්‍රාත්කාරයාට තියෙනවා කියන එක නෙමෙයි. මේකට පූර්ණ සාකච්ඡාවකට ඔබතුමා දිනයක් දාගන්න. මටත් කතා කරන්න.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------

විපක්ෂ සංවිධායකතුමා ඔබතුමා ඔබතුමාගේ ලිපිය මම සභාගත කරනවා. අර පාර සම්බන්ධ වාර්තාවක් ලබන සභා වාරයට ලැබීමට කටයුතු කරනවා.

***ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර***
***கௌரவ உறுப்பினர் உபுல் ஷாமல் பண்டார***
*Hon.Member Upul Shyamal Bandara*
---------------------------------------------

ගරු සභාපතිතුමනි මම නියෝජනය කරන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෙලවරේම ආසනයේ. මාවනැල්ලේ මම නියෝජනය කරන ආසනයේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා පක්ෂයේ මහ ලේකම්තුමා. අපේ ආසනයේ පාසැල් පිළිබඳ ගැටළු විශාල වශයෙන් තියෙනවා. මහ ලේකම්තුමාත් යොමු කරන්නේ මට. පළාත් සභාවෙන් කර ගන්න. නමුත් අධ්‍යාපන ඇමතිතුමා සභාව දවසට නෑ. පහුගිය සභා ගණනාවකදීත් මම අරගෙන ආවා. අධ්‍යාපන ඇමතිතුමා නෑ. අපි කාත් එක්කද කතා කරන්නේ. ඊළඟට ගරු සභාපතිතුමනි මගේ ගමේ පාසැල මෙනේරිගම මහා විද්‍යාලය . ළඟම පාසැල හොඳම පාසැලටත් තේරිලා ඉන්නේ.මේකේ විදුහල්පති ස්වාමීන් වහන්සේ ඉවත් කරලා මේ වෙන කොට රඹුක්කන සුජාතා මහ විද්‍යාලයේ විදුහල්පතිනිය මෙනේරිගම මහා විද්‍යාලයට දාලා තියෙනවා. ගරු මහ ඇමතිතුමනි මට දැන ගන්න තියෙන කාරණාව හැටියට මාව දැනුවත් කළේ අපේ මහ ලේකම්තුමා. විනය චෝදනා ප්‍රශ්න තියෙන විදුහල්පතිනියක්. එතකෙට මේ වෙන කොට මෙනේරිගම මහා විද්‍යාලය ඉහළ ප්‍රතිඵල පෙන්වලා ඉතාම ක්‍රමවත්ව ආපු පාසැලක්. මහ ඇමතිතුමාගේ පෞද්ගලිකව දන්නවා. ඒවගේ තැනකට ඒවගේ කෙනෙක් පත් කළේ ඇයි කියන එක ගැන මිනිස්සු අපෙන් ප්‍රශ්න කරනවා. ඒ නිසා ඒ පිළිබඳව අධ්‍යාපන ඇමතිතුමා නැතත් ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ පිළිබඳව හොයා බලලා ඔබතුමා අධ්‍යාපනයට ඉතාම ආදරෙයි. අධ්‍යාපනය නන්වන්න කටයුතු කරපු ඒ ස්වාමීන් වහන්සේ හෝ ඊට සුදුසු වෙනත් කෙනෙක් පත් කරන්න කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් කරනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon.Chief Minister Mahipala Herath*
---------------------------------------------

ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බලලා මම අධ්‍යාපන ඇමතිතුමාට විස්තර ඉදිරිපත් කරන්නම්.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------

ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය තියෙන්නේ අද මේ වෙන කොට අධ්‍යාපන ඇමතිතුමා විදේශගත වෙලා ඉන්නේ. අද ඒ කාරණාවට සමාව දිය යුතුයි. නැතුව අපි එහෙම නොවෙන්නට කතා කරලා සාකච්ඡා කර ගන්නම්.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*
---------------------------------------------

ගරු සභාපතිතුමනි තව ප්‍රශ්නයක් තියෙනවා. මේක 2015.10.13 වෙනි දින සභාගත කළා ඇඹ්පොළ ශ්‍රී මහින්ද විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ අත්තනෝමතික කටයුතු පිළිබඳව. මගේ හිතේ මේ හත් වෙනි මාසයේ මෙ වෙනකන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විෂය භාර අමාත්‍යවරයා හෝ නිලධාරීතුමෙක්ගෙන් හෝ තුමියකගෙන් කිසිදු පිළිතුරක් ලැබිලා නෑ. හැබැයි ගරු සභාපතිතුමනි අර උපුල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ කොයි වෙලාවකවත් අධ්‍යාපන ඇමතිතුමා සභාවේ නෑ. ප්‍රශ්නයක් හෝ අධ්‍යාපනය පිළිබඳව කතා කිරීමේදී. හැබැයි ප්‍රධාන ඇමතිතුමාට ගෞරවනීය ස්තූතිය පුද කරන්නට ඕනේ මොකද එතුමා අධ්‍යාපන ඇමතිවරයාව කටයුතු කරන කොට මේ සියල්ලටම ඇහුන්කන් දුන්නා. ඒවගේම තමයි ඇඹ්පොළ ශ්‍රී මහින්ද විද්‍යාලයේ එක වසර ආරම්භ කරන්න 2017 පටන් ගන්න තියෙන කොට ප්‍රධාන ඇමතිතුමා මුල් වෙලා තමයි එක වසර පටන් ගන්න කටයුතු කළේ. හැබැයි අධ්‍යාපන ඇමතිවරයා කිසිම තැකීමක් කළේ නෑ ළමයි නෑ කියලා. හැබැයි ඒවගේ තත්ත්වයක් තුළ අධිකරණ තීන්දුවක් තියෙනවා. මොකද පහුගිය සතියට එහා සතියේ දරුවෙකුට ගහලා කන් අඩිය පුපුරලා අවිස්සාවේල්ලේ 10 වෙනි වාට්ටුවේ දවස් තුනක් රෝහලේ හිටියා. එතකොට මේවා වෙන්න ඉස්සෙල්ලා තමයි සභාගත කළේ දහ වෙනි මාසයේ 15 වෙනිදා. මේ පිළිබඳව කිසිම පරීක්ෂණයක් කරලා මේ සභාවට ඇවිල්ලා නෑ සභාගත කරපු ලිපිය. එතකෙට ගරු සභාපතිතුමනි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි මම අහන්නේ ඒ සිද්ධිය වෙන්නේ නෑ ඒ පරීක්ෂණය කරලා ඒ වාර්තාවක් ඉදිරිපත් කරලා ඒ විදුහල්පතිවරයා පිළිබඳව අපි කියන්නේ රක්ෂාව නැති කරන්න නෙමෙයි. අඩුම ගානේ අවුරුදු 20 ක් තිස්සේ ඉන්න විදුහල්පතිවරයා ස්ථානීය මාරුවක්වත් කරා නම් මේ සිද්ධිය වෙන්නේ නෑ. දැන් මේ වෙන කොට ඒ දරුවාගේ කන ඇහෙන්නේ නෑ. මාසයක් ගියාට පස්සේ හොඳ වුණොත් එහෙමයි. නැත්නම් ඔපරේෂන් එකකට යන්න ඕනේ කියලා වෛද්‍ය වාර්තාවල තියෙනවා. ඉතිං ගරු සභාපතිතුමනි මම කියන්නේ මගේ පෞද්ගලික තරහක් නෙමෙයි. ඇඹ්පොළ ශ්‍රී මහින්ද විද්‍යාලය ළමයි 953 ක් හිටපු පාසැලේ දැන් 382 යි ඉන්නේ එක වසරත් පටන් ගත්තට පසුව. මම කියන්නේ මම මූලික අධ්‍යානය ලබපු පාසැල. එහෙම නම් මේ පාසැල වැටෙනවාට අපි කැමති නෑ. ඒක නිසා

මම ගරු සභාපතිතුමනි විෂය භාර අමාත්‍යවරයාට කිච්චත් වැඩක් නෑ. මගේ හිතේ ඒකේ වැඩ බලන්නේත් ප්‍රධාන අමාත්‍යවරයා කියලා මගේ විශ්වාසය. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ලේකම්තුමා සම්බන්ධ කරලා වාර්තාවක් ලබා දෙන්න කටයුතු කරන්නම්. මෙතුමා මුළු පළාත් සභාවේම වැඩ බලනවා. එතුමාට වගකීමක් තියෙනවා. එතුමා ඒ වගකීමෙන් පැහැර හරින්නේ නෑ. අජිත් ශාමින්ද ගරු මන්ත්‍රීතුමා

***ගරු මන්ත්‍රී අජිත්*** *ශාමින්ද*
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*

---

ගරු සභාපතිතුමනි මට තියෙන ප්‍රශ්නය පෞද්ගලික ප්‍රකාශ කරීම් යටතේ ,සමාවෙන්න මානියංගම වෙලංගල්ල මාර්ගය මේ වෙන කොට අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන්න ආරම්භ කරලා තියෙන්නේ. දැන් ඒ මාර්ගය සංවර්ධනය කිරීමේදී විශාල ගැටළුසහගත තත්ත්වයන් තියෙනවා කියලා ප්‍රදේශවාසීන් කළබලයට පත් වෙලා තියෙනවා. දැන් ඊයේ මුළු ගමම එකතු වෙලා ලොකු සාකච්ඡාවක් තිබ්බා. ඒගොල්ලෝ උද්ඝෝෂණයක් දක්වාත් යන්න තිබියදී තමයි මේ කරුණු ටික මට ගම්වාසීන් ඉදිරිපත් කළේ පළාත් සභාව හෙට තියනවා කියලා. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, ආරංචියේ හැටියට කිලෝ මීටරයකට මිලියන 20 ක් වගේ විශාල මුදල් වෙන් වෙනවා මේ අයිරෝඩ්ස් ව්‍යාපෘතිය තුළ. නමුත් මාර්ගය මුලදී සැළසුම් කරපු ආකාරයට පළල් වීමක් වෙන්නේ නෑ. දැන් ටිකක් පොඩි කරලා තියනවා මුදල් මදි කියලා. ඒ කෙසේ වෙතත් ජනතාව ඒකත් පිළිගත්තා එහෙම නම් ඒ විදිහට හදලා දෙන්න කියලා. නමුත් දැන් වෙනකොට මාර්ගයක් කාපට් කරන ක්‍රමවේදයට නෙමෙයි මේ මාර්ගය කාපට් කරන්න යන්නේ. ඒගොල්ලෝ කරුණු කීපයක්ම ප්‍රධාන කරුණු වශයෙන් මාර්ගයේ තිබෙන බෝක්කු බොහොමයක් අතහැරදමා ඒවා වසා දැමීම. ඊළඟට කාණු පද්ධතිය නිසි ආකාරව සංවර්ධනය නොවීම. ඒ වගේම අබලන් වූ පැරණි බෝක්කු සම්පූර්ණයෙන්ම ඉවත් නොකර ඒවා කොටස් එල්ලීම පමණක් සිදුකිරීම. ප්‍රධාන පාලම් දෙක පාදම අබලන්ව තිබියදීත් ඒවා ප්‍රතිසංස්කරණය නොකිරීම. කුඹුරු හා වගුරුබිම් මඩ තිබියදීම ගල් අතුරා සංවර්ධනය කිරීම. කුඹුරු ඇති ස්ථානවල මාර්ගයේ යටි අත සංවර්ධනය නොකිරීම. ඉහත සියළු අඩුපාඩුකම් තිබියදීත් මාර්ගයේ පළවෙනි කාපට් අතුරා කොන්ත්‍රාත්කරුගේ යන්ත්‍ර සූත්‍ර කාපට් එක උඩින් නිතර ගමන් කරවීම. කොන්ත්‍රාත්කරුවන්ගෙන් සිදුවන දූෂණ හා අක්‍රමිකතා. දැන් මේ කරුණු කෙටියෙන් කිව්වේ ගරු සභාපතිතුමනි, මේ මාර්ගය පළාත් සභා මාර්ගයක්. දැන් මේ අයි රෝඩ්ස් හරි මොන ව්‍යාපෘතියෙන් කරලා ගියත් අන්තිමට මේක සබරගමුව පළාත් සභාවේ මාර්ගයක්. මේකට වගකියන්න වෙන්නේ පළාත් සභාව. ඉතින් විශේෂයෙන්ම දැන් මමත් ගිහින් පරීක්ෂා කළාම ඒ වෙලංගල්ල මාර්ගය කියන මාර්ගය වැඩිය උස මාර්ගයක් නෙමෙයි. ගොඩාක් කුඹුරු මැදින් යන පාරක්. ඉතින් අඩුම ගානේ යටි පැත්තට පැති බැම්මක්වත් දැම්මේ නැත්නම් වැඩි බර තියන වාහනයක් යැමේ දී පාර නෙරපීමක් සිදුවෙනවා. විශේෂයෙන්ම දැන් මීටරයක් හරි මීටර් දෙකක් හරි යටට හාරලා ඒ.බී.සී හරි ගල් හරි අතුරලා කාපට් දාන්න තියන එක මඩ ගොඩටම ගල්

ටිකත් දාලා තමයි හදන්නේ. ඉතින් ඒ විදිහට අක්‍රමිකතා රාශියක් සිදුවෙන බව අපටත් පේනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, දැන් තවම කිලෝ මීටරයයි කාපට් ඉවර වෙලා තියෙන්නේ. දැන් ඒක ඉවර වුනත් ඒක උඩත් අර බැකෝවල ජැක් ගහලා කාපට් එක එබෙන විදිහට නැවතත් වැඩ කරනවා. ඉතින් ඒ නිසා අපි දැන් මේක් අයි රෝඩ්ස් ව්‍යාපෘතියේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් අධීක්ෂණය කළා කියලා අපට බලාගෙන ඉන්න බෑ. මොකද අන්තිමට අපට වගකියන්න සිදුවෙන නිසා. ඒ නිසා මම ගරු සභාපතිතුමනි, ඉල්ලා සිටින්නේ මාර්ග අමාත්‍යාංශයට අපි මේ පළාත් සභාවේ යෝජනාවක් සම්මත කරලා හරි මේක ගැන පොඩි අධීක්ෂණයක්. දැන් අපට කියන්න ඉන්නේ විධායක ඉංජිනේරු. විධායක ඉංජිනේරුට කථා කළාම එයා කියනවා මට කිසිම බලයක් නෑ මේක ගැන. අපේ සම්බන්ධතාවයකින් තොරව තමයි මේ සංවර්ධනය කෙරෙන්නේ කියලා. දැන් කෙසේ වෙතත් අපි දන්නවා අයි රෝඩ්ස් ව්‍යාපෘතිය පසුගිය ආණ්ඩුවෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ ආරම්භ කරපු එකක්. ඒක ඒ ලෙසම පාරවල් වෙනස් කරන්නේ නැතුව කෙරෙන්නේ. ඉතින් මේක ණය ආධාර ව්‍යාපෘතියක්. ඉතින් කොහොම කළත් මේ ණය ගෙවන්න වෙන්නේ මහජන මුදල්. ඉතින් ඒ නිසා මේක ඒගොල්ලන්ට ඕන විදිහට කෙරෙන්න දුන්නොත් එහෙම ඇති වැඩක් වෙන්නේ නෑ. මම හිතන්නේ මේ වෙලංගල්ල පාරට විතරක් නෙමෙයි අනෙක් අයි රෝඩ්ස් ව්‍යාපෘතිවලටත් මේක අදාළයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂ අවධානයක් යොමු කරලා මේක ගැන අධීක්ෂණයක් කරන්න. නැවත නැවත මේක ගැන හොයලා බලන්න. අවශ්‍ය කටයුතු කඩිනමින් ගන්න කියන යෝජනාව තමයි මම ඉදිරිපත් කරන්නේ. මේකේ දීර්ඝ වශයෙන් කරුණු තියනවා. මම මේවා කියන්න කාලය ගන්නෙ නෑ. සභාගත කරනවා. ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ ක්ෂණිකව තීන්දුවක් ලබාදෙන්න මේක ගැන පළාත් සභාවේ මාර්ග අමාත්‍යාංශයෙන් අධීක්ෂණය කරලා ඒකට මේවා වළක්වන්න, නවත්වන්න නෙමෙයි අපි ඉල්ලා සිටින්නේ. හදන පාර නිසි ප්‍රමිතියට හදලා දෙන්න. ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*

*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த*

*Hon. Minister Athula Kumara Rahubadda*

*-----------------------------------------------------*

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමා ගෙනාපු ප්‍රශ්නයම තමයි මේ මෑත කාලයක ඉඳලා අපට තියන ප්‍රශ්න ටික. මේක පහුගිය ආණ්ඩුවෙත් ඔය වැරැද්දම කරපු නිසා වැරැද්දට වැරදියි කියපු දේවල් අහන්නේ නැතුව කරපු ඒවායේ ප්‍රතිඵල අපි වින්දා කියලා කිව්වා. ඒකම නම් මේ ආණ්ඩුවත් කරන්නේ ඉතින් මේක බරපතල ප්‍රශ්නයක්. මනුස්සකමට සමහර මැති ඇමතිවරු පාර්ලිමේන්තුවේ බැණලා අපේ පාරවල්වලට බලෙන් ගිහිල්ලා බෑවා. අපි ටෙන්ඩර් එක පස්සට ගත්තා. ටෙන්ඩර් එක දාලා තිබුණ අපි අකුලා ගත්තා. අපට ඕනකම තියෙන්නේ පාර හොඳට හදන්න. අපි තාරවලට දාපු ටෙන්ඩර් එකට උඩින් ගිහිල්ලා ගල් බෑවා. මම නම් ගම් කියන්නේ නෑ. බයට නෙමෙයි සදාචාරයට මගේ තියන. ඉතින් ඒ නිසා ඒවා අපි භාරදුන්නාම අපි බැලුවේ අපේ මිනිස්සුන්ට හොඳම දේ කාපට් එක. ඉතින් ඒ කාපට් එකත් අර කියනවා වගේ සිද්ධ වෙනවා නම් සිරිපාල මන්ත්‍රීතුමා හැමදාම දොස් නගන්නේ මෙන්න මේ කාරණාවට. අපේ දෙයක්, අපි වත්ත බද්දට දීලා ඇස්සට දත නියෝනවා. එතකොට ඒකේ අපි හැමදාම ඉල්ලන්නේ අපට මුදල් නෙමෙයි. අපේ නිළධාරීන්ට වගකීමක් තියනවා. ඒ වගකීම භාරදෙන්න. ඒ වගකීම භාරදුන්නා නම් මෙහෙම සිද්ධ වෙන්නේ නෑ. අපේ නිළධාරීන් එහෙම ඉඩක් දෙන්නෙම නෑ. මොකද ඔවුන්ටයි ඒ වගකීම එන්නේ. ඒ

නිසා අවසානයේ දී මේ දෙපාර්ශවයම තමන්ගේ කාර්යය භාරය කරගෙන අයින් වෙනවා. ඉන්න මිනිහාට හරි එන මිනිහාට හරි අවසානයේ දී වෙන්නේ බැණුම් අහන එක. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ගරු ප්‍රධාන ඇමතිතුමා එක්ක මේ මුළු සභාවෙන්ම මම ඉල්ලීමක් කරන්නේ අපට මේ කරන අයි රෝඩ්ස් ව්‍යාපෘතිය, අපි තමයි පළාත් සභාව විදිහට යෝජනා කරන්නේ. අපට ඒකේ ගැටළුවක් නෑ. දුර ප්‍රමාණය, බෝක්කු ටික මෙතුමා කියපු දේවල් ඔය සුද්දා ගල් පළුවලින් හදපු දේවල් අපේ ඉංජිනේරුවෝ තමයි දන්නේ. ඒ නිසා ඒවයි හදන්න ඕන කිව්වේ. අවුරුදු 100 කට කලින් ගල පැනලා තියනවා. මේකට අදාළ කරන භාගය හදන එක නෙමෙයි. ඒක දාලා හදන්න. ඒක හින්දා තමයි කිලෝ මීටරයකට මිලියන 200 ක් යන්නේ. අපි පළාත් සභාවෙන් හදනකොට 80 යි 100 යි අතරේ තමයි අපට ගියේ. දැන් අද 200 ක් වෙලා තියනවා. ඒ 200 ඇතුලේ ගලපන්න පුළුවන්කම තියනවා. ඉතින් ඒ නිසා අඩුම තරමින් අපි මධ්‍යම ආණ්ඩුවට යෝජනාවක් විදිහට යවමු මේ මාර්ග පිළිබඳව, විශේෂයෙන් පළාත් මාර්ග අයි රෝඩ්ස් ව්‍යාපෘතිය යටතේ අදාළ ඉංජිනේරුවරයාගේ අධීක්ෂණයත් සමඟ මාර්ග සංවර්ධන අධිකාරියට ඉදිකිරීම් කටයුතු, කොන්ත්‍රාත් කටයුතු අවශ්‍ය ඕන විදිහකට කළාට අපේ කිසි ගැටළුවක් නෑ. හැබැයි අපේ නිළධාරීන්ගේ අධීක්ෂණය ලබාදෙන්න කියන යෝජනාව මම මේ වෙලාවේ කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

අපේ අජිත් ශ්‍යාමින්ද ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වැදගත් යෝජනාවක්. මේ පාරවල්වල ඊළඟට ගැටළුව තියෙන්නේ පළල.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

---

අපට නම් ගම් කියන්න විදිහක් නෑ. ඒක සමහරු හිතනවා නම් ඒක අපේ නොහැකියාවක් කියලා ඒක අපට කරන්න පුළුවන්. ඉතිහාසයේ අපි එහෙම කළා පළාත් සභාවක් විදිහට අපි. නඩු දාලා ජය ගත්ත ඉතිහාසයක් තියනවා. නමුත් අපට අදාළ වෙන්නේ එහෙම තැනකට පරිවර්තනය වෙන්න නෙමෙයි. ඒ වැඩ පිළිවෙලට සහයෝගය දීම. ඉතින් ඒ සහයෝගය සදාචාරත්මකව ගන්නවා නම් මේක මීට වඩා හොඳට මේ ජනතාව බලාපොරොත්තු වෙන දේ අපි හැමෝටම එකතු වෙලා, හොඳ විදිහට කරන්න පුළුවන්.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ගැටළු රාශියක් තියනවා. එකක් තමයි ඒ පාරවල්වල පළල සමහර වෙලාවට තියන ප්‍රමාණයට හදනවා. එහෙම නැත්නම් උපරිම තියෙන්නේ අඩි 12 ට පළල. ඉතින් එහෙම කෝටි ගාණක් වියදම් කරලා හැදීමේ තේරුමක් නෑ. ඒ නිසා....

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ඇයි එහෙම කියන්නේ ? මේ රත්නපුර දිස්ත්‍රික්කයේ හැදුවෙත් අඩි 10 ට, 12 ට තමයි පාරවල්. ඒ කාලේ හැදුවෙත් එහෙම තමයි. දැන් අපි ඒවා පෙන්වන්නම්. ඇරැපොල සිරි සමන්පුර පාර බලන්න.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

මන්ත්‍රීතුමා, ඒ කාලයේ හරි නැති හින්දානේ දැන් වෙනස් වෙලා තියෙන්නේ.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*

---

ගරු සභාපතිතුමනි, සිරිපාල මන්ත්‍රීතුමා කියන කාරණාව ඇත්ත. හැබැයි වෙන් කරලා තියන මුදලේ අඩුවක් වුනේ නෑ. උදාහරණයට වේවැල්වත්ත මාර්ගය. එතුමා හොඳ දේවල් ගේනවා. නමුත් ඒක නෙමෙයි වෙලා තියෙන්නේ මේ ප්‍රශ්නය තුළ. වේවැල්වත්තේ අපි අදාළ විදිහට ගෙනවා. හැබැයි අද මල්වලින් මෙහාට බෝතලේ වගේ වෙලා. මේකයි වෙන්න ඕන. එදා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී මෙතුමා යෝජනාවක් ගෙනාවා. ඇහැළියගොඩ ප්‍රධාන මාර්ගය. ඇහැළියගොඩ මාර්ගයේ දී ආපහු හොඳට ඇවිල්ලා හීන් වෙලා. ඉතින් ඒ නිසා අපි කියන්නේ ඒ වෙන් කරලා තියන මුදල ඇතුළත ඒක කරන එක අසාධාරණයක්. ඇස්තමේන්තුව අනුව කවුරු කළත් ඒක කරන්න ඕන.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

මේ සම්බන්ධයෙන් ප්‍රධාන ඇමතිතුමාත්, ඒ වගේම මාර්ග ඇමතිතුමාත් සම්බන්ධ වෙලා මේ පිළිබඳව අදාළ නිළධාරීන් සහ අදාළ ආයතනත් එක්ක සම්බන්ධ වෙලා මේ පළාත් සභාවට අයිති පාරවල්. ඊළඟට ප්‍රාදේශීය සභාවට අයිති පාරවල් තමයි මේ අයි රෝඩ්ස් ව්‍යාපෘතිය යටතේ කෙරෙන්නේ. එතකොට ඒ සම්බන්ධව මැදිහත් වෙලා මේක කෙරෙන විදිහට, ප්‍රයෝජනයක් වෙන විදිහට කිරීමට කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි, සමාවෙන්න මේක දිගින් දිගට අදිනවාට. තව ප්‍රශ්නයක් දැන් තමුන්නාන්සේලාට පිළිතුරු දෙන්න ලිපිය ආවේ නැති නිසා මම මේ කියන්නේ. මම ගත්තේ පරණගම පාරේ ගංගාරාම පන්සල ගාව පාළම. ඒ පාළම මම ගිය සභාවේ දී දුන්නා ගරු ඇමතිතුමා සභාගත කළා මේ පාළම කඩාගෙන ගියොත් ඒ ප්‍රදේශයේ ගම්මාන විසි ගාණකට යන පාර අහිමි වෙනවා කියලා. මේක අපේ ගරු ඇමතිතුමා කිව්වා රාජ්‍ය මැණික් සංස්ථාවට කිව්වා කියලා. රාජ්‍ය මැණික් සංස්ථාවට කිව්වාට කවදාවත් හදන්නේ නෑ. තව අවුරුදු 20 ක් ගියත් ඔච්චරයි කථාව. මේ පාළම යටින් ගොච්චා වෙලා තියෙන්නේ. බැකෝ පතල් දාලා. ඉතින් මේ පාළම ගැන විශේෂ අවධානය යොමු කරන්න කියලා තමයි මම නැවත වාරයක් අපේ ප්‍රධාන ඇමතිතුමාට ලිව්වා. මොකද මට උත්තරයක් නැත්නම් මම යනවා යන්න තියන හැම තැනකම. දැන් ප්‍රධාන ඇමතිතුමාට ලිව්වේ මේ පාළම වහාම අධීක්ෂණයට ලක් කරලා ඒ පැත්තක් දාලා තියන එක සකස් කරලා දෙන්න කියලා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------------------------------

ලිපිය සභාගත කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

මම එච්චේ ගරු සභාපතිතුමා මඟින් ගරු ප්‍රධාන ඇමතිතුමාට කියලා එවලා තියෙන්නේ.

***ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ***
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේක දිගටම තියන ප්‍රශ්නයක්. මේ තෙප්පනාව කඳන්ගොඩ පාරත් එහෙමයි. කුරුවිටත් මෙහෙමයි. මෙහෙත් මෙහෙමයි. හැම තැනම මෙහෙමයි. ඉතින් මේක පළාත් සභාවක් විදිහට අපේ නිළධාරියෙක් ගිහිල්ලා කරන්න තියන පැමිණිල්ල පොලීසියේ. මේ නිළධාරීන් සියළු දේ, හැමදාම ඔබතුමන්ලා මේ ප්‍රශ්න ඉදිරිපත් කළාම ඒ ක්ෂණයකින් ගිහිල්ලා පැමිණිල්ල දානවා. මැණික් සංස්ථාවට ඉදිරිපත් කරනවා. නමුත් අවසානයේ වෙන්නෙ හැමදාම මේ වෙන දේ. ඉතින් ඊට එහා දෙයක් සිද්ධ වුනේ නෑ. කුරුවිට ගිලා බහින්නයි තට්ටු 68 ක් යනකල් මේ සිද්ධිය ක්‍රියාදාමයක් විදිහට සිද්ධ වුනේ. මේක ඉවරයි. ඒ කාලවල ඒ දේශපාලන බලය. මේ කාලයේ මේ දේශපාලනය. මම කියන්නේ මේ කට්ටියම එකතු වෙලා කවුරු කළත් මේ වැරැද්දට වැරදි විදිහට මේක තහනමකට ලක් කරන්න යෝජනාවක් සම්මත කරමු සම්බන්ධීකරණයේ. ඔබතුමා ගේන්න. මම ස්ථිර කරනවා. මට කවුරු තරහා වුනත් ප්‍රශ්නයක් නෑ.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල***
***கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.Member Ranjith Pollgampola*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ අජිත් ශ්‍යාමින් මන්ත්‍රීතුමා කථා කරපු දැරණියගල ආසනයේ තියන වෙලංගල්ල පාර අයි රෝඩ් ව්‍යාපෘතියට අයිති පාරක්. අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමා කියපු කාරණාව ඇත්ත. ගමේ ජනතාවගේ විරෝධතාවයක් තියනවා. අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමනි, මේක අපි දෙහිඕවිට සම්බන්ධීකරණ රැස්වීමේ දී ඊබට් සිල්වා සමාගමත් මහා මාර්ග අමාත්‍යාංශයේ නිළධාරීන් එක්ක, ගමේ අයත් එක්ක සාකච්ඡාවක් දාලා ඒගොල්ලන්ව දැනුවත් කිරීමක් කරමු මේ සම්බන්ධයෙන්. ඒ කියන්නේ කාණු දානවාද ? ප්‍රමිතිය මොකක්ද කියන එක ගැන අපි හැමෝම එකතු වෙලා සාකච්ඡාවක් කරමු. ඒ එක්කම අපේ අතුල කුමාර ඇමතිතුමාට අපි කියමු එතුමාගේ අමාත්‍යාංශයෙන් සම්පූර්ණ අධීක්ෂණයක් කිරීම අත්‍යාවශ්‍යයි කියන එකත් අපි කියමු. ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී අපි අජිත් ශ්‍යාමින්ද මන්ත්‍රීතුමාත් එක්ක සාකච්ඡා කරලා ඒ පාර සම්බන්ධයෙන් කටයුතු කරමු.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ දැරණියගල පාරක් සම්බන්ධයෙන් අපේ ගරු මන්ත්‍රීතුමා කථා කළා. මේ විදිහේ දූෂිත විදිහට වැඩ වෙනවා කියන එක. අපි කවුරුත් මහජන නියෝජිතයෝ හැටියට මේ සභාවේ කථා කළේ. දූෂණය නාස්තිය පිටු දැකලා අපි කටයුතු කරනවා. එතනදී පහුගිය ආණ්ඩුවද නව ආණ්ඩුව ද කියන එක නෙමෙයි ගැටළුව. මහජන මුදල් නාස්ති කරනවා නම් ඒකට අපි ඉදිරිපත් වීමක් වෙන්න ඕන. ඒ මන්ත්‍රීතුමා කියපු කාරණාව ඇත්ත නම් මේක අපි බලාපොරොත්තු වෙනවා සම්බන්ධීකරණ රැස්වීමේ දී කථා කරපුවාම. ඒ වගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දිත් මේ ගැන මතු කළා. ඒ කියන්නේ මහජන මුදල් නාස්ති කරන්න අපි ඉඩදෙන්නේ නෑ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වෙලාවේ එතුමා ඒ දූෂිත වැඩ පිළිවෙල ගැන සභාව දැනුවත් කිරීම ගැන. අපි ඉදිරියේ දී මේ ගැන විස්තර හොයලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම තුළ මේ ගැන විසඳුමක් ගන්න බලාපොරොත්තු වෙනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තුතියි විපක්ෂනායකතුමා. අනුරප්‍රිය නමින්ද මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

---

බොහොම ස්තුතියි නියෝජ්‍ය සභාපතිතුමනි. පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මම අවස්ථාවක් ඉල්ලා සිටියේ. ගරු සභාපතිතුමනි, මගේ ගම තිබෙන්නේ පුවක්ගහදෙණියේ. පුවක්ගහදෙණිය ගමේ තිබෙන මාර්ගයක් තමයි වියලගොඩ මාහිංගොඩ කියන මාර්ගය. මේ මාර්ගය මෑතකදී මමත් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාත් අපි දෙන්නාම ගියා මේකේ කාපට් අතුරන්න. අයි රෝඩ්ස් ව්‍යාපෘතිය යටතේ කරන ව්‍යාපෘතියක්. ගරු සභාපතිතුමනි, මේ මාර්ගයේ මම දැනට දවස් කීපයකට ඉස්සෙල්ලා ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවා ගමේ අයගේ ඉල්ලීම අනුව. ඒකේ ස්ථාන කීපයක අගල් 3 ක් විතර තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාපට් අතුරලා තියෙන්නේ. අගල් තුනකුත් නැති තැන් තියනවා මම ගිහිල්ලා බැලුවා. ඒ නිසා මම කියන්නේ මේක විශාල මුදලක් වියදම් කරලා කරන ව්‍යාපෘතියක්.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

අගල් තුනක් තියනවා නම් හොඳටම ඇති. අගල් එක හමාරයි පහුගිය කාලයේ තිබුනේ.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

---

මම දන්නේ නෑ කොහොමද කියලා. අගල් දෙකකුත් නැති ප්‍රමාණයක් තමයි තියෙන්නේ. ගරු සභාපතිතුමනි, මේක විහිළුවට ගන්න එපා. මම සත්‍ය කාරණාවක් කියන්නේ. මේ මාර්ගය ඇත්තටම කෙටි මාර්ගයක්. මගේ ගමට තමයි මේ පාර වැටෙන්නේ. අනෙක මගේ

පියාගේ නමින් මේ මාර්ගය නම් කරලා තියෙන්නේ අපේ හිටපු සභාපතිතුමා, සලිත කරුණාරත්න මැතිතුමා සභාපති හැටියට ඉන්න කාලයේ. ඉතින් මම කියන්නේ ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් කළයුතුයි. මේ මාර්ගයට මට මතක හැටියට කෝටි 4 ක වගේ මුදලක් වෙන් වෙලා තියනවා. හැබැයි මේකේ වැඩ අවසන් කරන්න ඉස්සෙල්ලා මේකේ නියමිත ප්‍රමිතිය තියනවාද කියන කාරණාව විශේෂයෙන්ම හොයලා බලලා කටයුතු කරන්න කියන කාරණාව මම මේ සභාවට මේ අවස්ථාවේ දී යෝජනා කර සිටිනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

අවසාන වශයෙන් අපේ බාස්කරන් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අන්නමලෛයි බාස්කරන්***
***கௌரவ உறுப்பினர் அண்ணாமலை பாஸ்கரன்***
*Hon.Member A.Basgaran*

---

கௌரவ சபைத் தலைவர் அவர்களே இந்த அதியுயர் சபையின் ஊடாக சபரகமுவ மாகாணத்தில் வாழும் கேகாலை மாவட்டம் அல்லது இரத்தினபுரி மாவட்டத்தில் வாழும் எங்கள் மக்களுடைய உட்கட்டமைப்பு பிரச்சினைகள் , தொழில் வாய்ப்பு பிரச்சினைகள் , கல்விப் பிரச்சினைகள் , மக்களுக்கு தேவையான போக்குவரத்துப் பிரச்சினைகள் சம்பந்தமாக மக்களுக்கு தேவையான விடயங்களை செய்து கொடுப்பதற்குமக்கள் பிரதிநிதிகளாக எங்களுடைய கௌரவ முதலமைச்சர் மற்றும் அமைச்சர்கள் உட்பட சபரகமுவ மாகாண சபையில் வேலை செய்து கொண்டு இருக்கின்றது என்பதில் எனக்கு அசைக்க முடியாத நம்பிக்கை இருக்கின்றது.இருந்த பொழுதிலும் கௌரவ தலைவர் அவர்களே நான் இந்த சபையிலே இதற்கு முன்பு என்னுடைய அமர்வுகளின் போது கல்வி அமைச்சர் அவர்களுக்கு நான் எடுத்துக் கூறியிருந்தேன் கேகாலை மாவட்டத்திலே கிட்டத்தட்ட எழுநூறு ஆசிரியப்பற்றாக்குறை இருக்கின்றது என்று.நாங்கள் ஓரளவு நிவர்த்தி செய்து இருந்தாலும் கூட இன்று பெருந்தோட்டத்துறையைச் சேர்ந்த மக்களின் பிள்ளைகளின் கல்வியில் நாங்கள் கடந்த சாதாரண தர பரீட்சையை உற்று நோக்குவோமேயானால் நாங்கள் மிகவும் பின்தங்கிய நிலையில் காணப்படுகின்றோம்.

பல்கலைக்கழகத்திற்கு தேர்ந்தெடுக்கும் பெருந்தோட்டத்துறையைச் சேர்ந்த எங்களுடைய மாணவ செல்வங்களின் எண்ணிக்கை மிகவும் குறைவாகவே இருக்கின்றது. கௌரவ தலைவர் அவர்களே இதை நான் உங்களுக்கு கூறுவது ஏன் என்றால் இம்முறை O/L பரீட்சையில் சித்தியை எங்களுடைய பெருந் தோட்டத்துறையைச் சேர்ந்த மாணவச் செல்வங்கள் A/L ஊடாக சித்தியினை எதிர்பார்க்க முடியும். பல்கலைக்கழகத்தில் எங்களுடைய

பெருந் தோட்டத்துறையைச் சேர்ந்த மாணவர்கள் எதிர்ப்பார்க்க முடியும். கேகாலை மாவட்டத்திலும் , இரத்தினபுரி மாவட்டத்திலும் பெருந் தோட்டத்துறையைச் சேர்ந்த எங்களுடைய மக்களுடைய கல்வி மிகவும் பின்தங்கிய நிலையில் இருக்கின்றது. அதற்கு ஒரு காரணம் இம்முறையும் கிட்டத்தட்ட அறுநூறு எழுநூறு பாடசாலைக்கு ஆசிரியப் பற்றாக்குறையாக இருக்கின்றது. ஆகவே இந்த அதியுயர் சபைக்கு மீண்டும் ஒரு முறை நான் தெரிவித்துக் கொள்கின்றேன் என்னவென்றால் உடனடியாக இந்த ஆசிரியப் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கு உடனடி நடவடிக்கை எடுக்கும் படி இந்த சபைக்கு நான் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.அது மாத்திரம் அல்லாமல் கடந்த சபை அமர்வின் போது இந்த கசிப்பு விற்பனை சம்பந்தமாக நான் எடுத்துக் கூறி இருந்தேன். இந்த அரசாங்கம் மதுபான வரியை கூட்டி இருக்கின்றது . புகைப்பிடிப்பதன் வரியைக் கூட்டி இருக்கின்றது. அதனூடாக மக்கள் மற்ற பக்கத்தில் பெருந் தோட்டத்துறையைச் சேர்ந்த கிராமங்களிலே இந்த கசிப்பு உற்பத்தி நூற்றுக்கு நூறு வீதம் அதிகரிக்கப்பட்டு இருக்கின்றது என்பதை இந்த அதியுயர் சபைக்கு தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். கடந்த சபையில் இதை நான் தெரிவித்து இருந்தேன். இருந்தாலும் இன்றுவரை அந்த கசிப்பு விற்பனைக்கு எதிராக எந்த பொலிஸில் இருந்தும் இதற்கு உரிய நடவடிக்கை எடுக்கவில்லை என இந்த அதியுயர் சபைக்கு நான் தெரியப்படுத்துகின்றேன். அது மாத்திரம் அல்லாமல் தண்ணீர் எட்டியாந்தோட்டை நகரத்திலே தண்ணீர் சம்பந்தமாக இந்த அதியுயர் சபைக்கு எடுத்துக் கூறி இருக்கின்றேன். இந்த தண்ணீர் சம்பந்தமாக ஒரு கிலாஸில் தண்ணீரை எடுக்கும் போது ஒட்டு மொத்தமாக வெறும் மண்டியைத் தான் நாம் குடிக்க வேண்டி இருக்கின்றது. கௌரவ சபைத் தலைவர் அவர்களே தயவு செய்து நாங்கள் உங்களுக்கு எடுத்துக் கூறுவதை உரிய சம்பந்தப்பட்ட அதிகாரிகளுக்கு தெரியப்படுத்தி இந்த தண்ணீர் சம்பந்தமாகவும் ஒரு முடிவைப் பெற்றுத் தருமாறு கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.அடுத்தபடியாக கடிதப் போக்குவரத்து தொடர்பாக பெருந் தோட்டத்துறையைச் சேர்ந்த , இந்த சபைக்கு கூறியிருந்தேன் நாங்கள் எங்கள் ஆதரவாளர்களுக்கு இந்த வாழ்த்து செய்திகளை அனுப்பும் போது கூட பனாவத்தை தோட்டத்திலே வாழ்த்துச் செய்திகள் பொதியில் கட்டி குவிக்கப்பட்டு இருந்தது. அதனை என்னுடைய கண்ணின் ஊடாக பார்த்தேன் என்றுக் கூறியிருந்தேன். ஆனால் இதுவரை சபைக்கு கூறியிருந்தும் அந்த பெருந் தோட்டத்துறையைச் சேர்ந்த மக்களுடைய தபால் சம்பந்தமாக இன்றுவரை நடவடிக்கை எதும் எடுக்கவில்லை என்பதை மிகவும் மனவருத்தத்துடன் கூறிக் கொள்ள

விரும்புகின்றேன். இந்த சபையில் எதாவது எடுத்துக் கூறும் போது மக்கள் சம்பந்தமாக நாம் கதைக்கின்றோம் . இங்கு இருக்கும் அனைத்து உறுப்பினர்களும் மக்கள் சம்பந்தமாக கதைக்கும் போது நடவடிக்கை எடுப்பதற்கு சம்பந்தப்பட்ட தபால் நிலையத்திற்கு தெரிவித்து உடனடியாக தபால் ஊழியர்களை நியமித்து இந்தக் குறைபாடுகளை தீர்த்து வைக்கும்படி கேட்டுக் கொள்கினறேன். அது மாத்திரம் அல்லாமல் இம்முறை மண்சரிவின் போது தெஹியோவிட்டை பாடசாலை முற்று முழுதாக பாதிக்கப்பட்டு இருக்கின்றது. எங்களுடைய முதலமைச்சர் மஹிபால ஹேரத் அவர்களுக்கு தெரியும் அவருடைய கவனத்திற்கு கொண்டு வந்து இருக்கின்றோம். அவருடைய உதவியில் சிங்கள தேசிய பாடசாலையிலே பகல் ஒரு மணியில் இருந்து ஐந்து மணிவரை அந்த பாடசாலை நடத்திக் கொண்டு இருக்கின்றோம். உடனடியாக அந்த பாடசாலைக்கு தேவையான இடத்தில் அந்த காணியைப் பெற்றுக் கொடுத்து அந்த பாடசாலையைத் தொடங்குவதற்கு முறையான நடவடிக்கை எடுக்கும் படி கேட்டு சந்தர்ப்பத்தை தந்த உங்களுக்கு நன்றியைத் தெரிவித்து விடை பெறுகின்றேன்.நன்றி.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි අපේ බාස්කරන් මන්ත්‍රීතුමා. වතුකරයටත් බලපාන යෝජනා රාශියක් ප්‍රශ්න රාශියක් පිළිබඳව එතුමා කතා කළේ. ඒ සම්බන්ධව ඉතිහාසයේ ඉඳන්ම තියෙනවා. විසඳිලා නෑ. ඒ කාරණාව අපිට මේ සභාව තුළින් විසඳන්න පුළුවන් කාරණා ඒ අදාල අංශ වෙත යොමු කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්න තීන්තු කරනවා. ඒවගේම ප්‍රධාන ඇමතිතුමා ප්‍රකාශයක්.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*

---

බාස්කරන් ගරු මන්ත්‍රීතුමා එතුමා නියෝජනය කරන එතුමාගේ සහෝදර ජනතාව වෙනුවෙන් කරන ලද ප්‍රශ්න සම්බන්ධයෙන් අප පළාත් සභාව හැකි සෑම අවස්ථාවකම අපේ සහයෝගය අපි ඉතා ඉහළින් ලබා දෙනවා. ඒවගේම ඒ අධ්‍යාපන වැඩ කටයුතු සම්බන්ධයෙන් විදුහලේ ප්‍රශ්නය සහ අනිකුත් සමාජ වැඩ කටයුතු සඳහා එතුමාගේ ඉල්ලීම අනුව ඉදිරියේදී කටයුතු කරන්නට

කටයුතු කරනවා කියන එක මම මේ අවස්ථාවේ බොහොම සංතෝසයෙන් එතුමාට පොරොන්දු වෙනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි.

**ශෝක ප්‍රකාශ යෝජනා:**

මේ යටතේ හිටපු ගරු මන්ත්‍රී එස්.එච්.එම්.ජෙවාහීර් මැතිතුමාට සබරගමුව පළාත් සභාවේ ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව. මේ සම්බන්ධව ප්‍රධාන අමාත්‍යතුමාට මම ආරාධනා කරනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*

---

ගරු සභාපතිතුමනි අපේ පළාත් සභාවේ හිටපු ගරු මන්ත්‍රීවරයෙක් ලෙස අපේ එස්.එච්.එම්.ජෙවාහීර් ගරු මන්ත්‍රීතුමාගේ අභාවය සම්බන්ධයෙන් මේ ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කරන මේ මොහොතේ විශේෂයෙන්ම අද සභාවට පැමිණ තිබෙන ඒ පවුලේ එතුමාගේ පුත්‍රයින් ඇතුළු ඥාතීන් සියළු දෙනාටම අපි පළමුවෙන්ම ඒ සම්බන්ධයෙන් අපේ බලවත් කණගාටුව එතුමාගේ අභාවය ගැන අපි ප්‍රකාශ කරනවා. සභාව වෙනුවෙන්. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි ජෙවාහීර් මන්ත්‍රීතුමා කියන්නේ එයා මුස්ලිම් සහෝදර ජාතිකයෙක් වුණත් එයා මාවනැල්ලට පමණක් නොවෙයි මුළු දිවයින පුරාම ජනප්‍රිය ව්‍යාපාරිකයෙක් ලෙස හැම කෙනෙක් සමගම හැම ජාතිකයෙක් හැම ආගමිකයෙක් කිසිම ආකාරයක මත ගැටුමක් නැතුව ජීවත් වුණු මිත්‍රශීලී සහෝදරත්වයෙන් වැඩ කරපු පුද්ගලයෙක් හැටියට තමයි අපි ජවාහීර් හිටපු ගරු මන්ත්‍රීතුමා දකින්නේ. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල සාමාජිකයෙක් ලෙස ඒ පක්ෂය වෙනුවෙන් එතුමාගේ වැඩ කටයුතු කළත් එතුමා සෑම අවස්ථාවකම අනිකුත් පක්ෂවල අය සමගම ඉතාම සුහදතාවයෙන් තම දේශපාලන ගමන කරගෙන ගිය ජනතා නියෝජිතයෙක් හැටියට තමයි ගරු සභාපතිතුමනි අපේ ජවාහීර් අපේ හිටපු ගරු මන්ත්‍රීතුමා දකින්නේ. එතුමා අපි මුණ ගැසුණත් තියෙන හිතවත්කම මිත්‍රත්වය කිසිම දේශපාලන මත ගැටුමකට නොගත්ත ඉතාම දේශපාලන අවබෝධයකින් කරපු කා අතරත් ජනප්‍රිය ගරු මන්ත්‍රීතුමෙක් හැටියට කටයුතු කළා කියන එක තමයි ජවාහීර් මන්ත්‍රීතුමා ගැන එතුමා කළ ඒ දේශපාලනය කරපු කාලය තුළ අපි දකින්නේ. ඒ නිසා විශේෂයෙන්ම ජවාහීර් මන්ත්‍රීතුමා ඒ පවුලේ තම ඥාතීන් සමග ඒවගේම ප්‍රදේශයේ ජනතාව සමග කිසිම භේදයකින් තොරව එතුමා ප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපරිකයෙක් ලෙස එවගේම තම ධන පරිත්‍යාගයන් ප්‍රදේශයේ සමාජ සේවාවන් සඳහා යොදවපු ජනතා නියෝජිතයෙක් ලෙස අපි දැකලා තියෙනවා. අපි අහලා තියෙනවා. ඒවගේම ඒ ආකාරයට කටයුතු කිරීම සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම එතුමාට සභාවේ අපේ ගෞරවය අපේ ප්‍රණාමය මේ අවස්ථාවේදී අපි පුද කරනවා. දීර්ඝ වශයෙන් ගරු සභාපතිතුමනි අපි කතා නොකළත් මේ ගරු සභාවට මටත් පෙර මේ සභාවට පැමිණි ජනතා නියෝජිතයෙක් ලෙස මේ ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙක්ම එතුමා සමග මේ සභාවේ බොහොම සුහදශීලීව කටයුතු කරපු කෙනෙක් ලෙස මේ හැම කෙනෙක්ම කතා බහ කරනවා. ඒවගේම එතුමා ගැන ඒ ආකාරයට අවබෝධයක් තියෙනවා. ඒ නිසා

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අපි අපේ ආණ්ඩු පක්ෂය අපේ ගරු අමාත්‍යතුමන්ලා ඒවගේම අපේ අනිකුත් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන්ම අපේ ආණ්ඩු පක්ෂයේ බලවත් කණගාටුව අපි මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ අද මේ අවස්ථාවට සම්බන්ධ වෙන එතුමාගේ දූ දරුවන් සහ අනිකුත් ඥාතීන් වෙත ප්‍රකාශ කරමින් විපක්ෂයත් ආණ්ඩු පක්ෂයත් අපි සභාවක් ලෙස ගරු සභාපතිතුමනි අපි හැම කෙනෙක්ගේම ශෝකය ඒ පවුල වෙත ලිපියකින් කණගාටුව ප්‍රකාශ කර යවන ලෙස ඉතා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් අපගේ බලවත් ශෝකය නැවත වරක් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-----------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. විපක්ෂය වෙනුවෙන් උපුල් ශ්‍යාමල් බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට අරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී උපුල් ශ්‍යාමල් බණ්ඩාර***
***கௌரவ உறுப்பினர் உபுல் ஷாமல் பண்டார***
*Hon.Member Upul Shyamal Bandara*

----------------------------------------

ගරු සභාපතිතුමනි ගරු මහ ඇමතිතුමනි ගරු අමාත්‍යවරුනි විපක්ෂනායකතුමනි ගරු මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රීතුමියනි මං හිතන්නේ ප්‍රමාද වෙලා හරි මේ ගරු සභාවට ජෙවාහීර් ගරු මන්ත්‍රීතුමාට ශෝක යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. මම නියෝජනය කරන මාවනැල්ල ආසනයේ මට කලින් නියෝජනය කරපු ජේ‍යෂ්ඨ ගරු මන්ත්‍රීවරයෙක් තසමයි ජෙවාහීර් හාජ්ජාර් මැතිතුමා කියන්නේ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වැදගත් දේශපාලනයේ නියැලුණු ප්‍රදේශය පුරා තමන්ගේ පෞද්ගලික මුදලිනුත් ධනපරිත්‍යාගය කරපු මාවනැල්ල ආසනයේ පමණක් නෙමෙයි කැගල්ල දිස්ත්‍රික්කයටම ආදර්ශයක් සපයපු ගරු මන්ත්‍රීවරයෙක් ලෙස තමයි මම එතුමාව දකින්නේ. එතුමා තමන්ගේ මන්ත්‍රී ධූරය හරහා සමාජයේ බැබලෙන්නවත් ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉහළට යන්නවත් අද ඉන්න අතලොස්සක් දේශපාලඥයෝ වගේ ක්‍රියා කළේ නෑ. එතුමා එතුමාගේ පෞද්ගලික මුදලින් එතුමාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් කටයුතු කරපු වැදගත් මහත්මයෙක් විදිහට තමයි මම දකින්නේ. එතුමා ඉස්ලාමීය භක්තිකයෙකු වුණත් මාවනැල්ල ආසනය ගත්තහම වැඩිපුරම සේවයක් කරලා තියෙන්නේ බෞද්ධ සිංහල අපේ ජනතාවට. උදාහරණ විදිහට කියනවා නම් මම අධ්‍යාපනය හදාරපු මාවනැල්ල මයුරපාද මහා විද්‍යාලය මම පාසැල් ශිෂ්‍යයෙක්ව ඉන්න අවධියේ එතුමා අපේ පාසැලට එතුමාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් විද්‍යාගාරයක් ලබලා දුන්නා. ඒවගේම එතුමා තමන්ගේ පෞද්ගලික කටයුතු මෙහෙයවන මොහොතක එතුමා හෙම්මාතගම මැවනැල්ල ආසනයේ තඹවිට හරන්කහවිට ගම් දෙක යාකරන්න මිනිස්සුන්ට ගමන් කරන්න විදිහක් තිබුණේ නෑ. ඒ අය ඉන්නවා පාලමක් හදලා දෙන්න කියලා. තමන්ගේ පුද්ගලික වියදමින් පාලමක් කරලා දුන්නා. ඒවගේම මන්ත්‍රී ධූරය දරපු කාලය තුළ එතුමා මන්ත්‍රී වැටුප ගත්තේ නෑ. පාසැල් දරුවන්ට ශිෂ්‍යත්ව ලබලා දුන්නා. එතෙන්දී මුස්ලිම් ජාතිකයෙක් කියලා මුස්ලිම් අය පවරලා දුන්නේ නෑ. සියළු දෙනාටම සමානව ශිෂ්‍යත්ව ආධාර සලසලා දුන්නා. ඒවගේම තමයි අදටත් මාවනැල්ල රෝහලේ ගැබිනි වාට්ටුව එතුමාගේ පුද්ගලික ධන පරිත්‍යාගයෙන්

හදලා දීපු කෙනෙක්. එහෙම නම් මේ වගේ කියාගෙන යනවා නම් එතුමා කරපු සේවය අතිවිශාලයි. ඒ හැම දෙයක්ම කළේ එතුමා විසින් උපයා ගත්ත ධන පරිත්‍යාගයෙන්. අවසාන වශයෙන් අවසාන කාලය වන කොට ව්‍යාපාර මට්ටමින් එතුමා යම්කිසි පහලට ආවා. ඒ වෙන කොට එතුමාට දේශපාලන වශයෙන් ඉල්ලීම් ලැබුණා වරප්‍රසාද වලට තමන්ගේ ප්‍රතිපත්තිය තමන්ගේ මාරු කරන්න. ඒ මොන තරම් ප්‍රශ්න ආර්ථික පීඩන ආවත් එතුමා තමන්ගේ ප්‍රතිපත්ති වෙනස් කළේ නෑ. හැමදාමත් හිටපු තමන්ගේ පක්ෂයේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පක්ෂයට හයියක් දක්වමින් එතුමා අපිත් එක්ක රැඳිලා හිටියා. මට මතකයි එතුමා දේශපාලනය කරපු කාලයේ අපේ මහ ඇමතිතුමා කිව්වා වගේ එතුමා පක්ෂ විපක්ෂ හැමෝමත් එක්ක සහෝදරත්වයෙන් තමයි කටයුතු කළේ. හැබැයි එතුමගේ නිවසටම ඇවිල්ලා එතුමාට මැර තර්ජනය කරලා එතුමාගේ දේපළ වලට හානි කරපු අවස්ථා තිබුණා. නමුත් එතුමා ඒ කිසිවකින් සැලුණේ නෑ. එහෙම එතුමාට හානි කළා කියලා එතුමා හානි කරන්න ගියේ නෑ. හැමෝමත් එක්ක් බොහොම සුහදව කුළුපගව දේශපාලන කටයුතුවල නිරත වුණා. මං හිතන්නේ ඒවගේ දේශපාලඥයෝ ඉස්සර නම් වැඩි වශයෙන් හිටියාට වර්තමානය වෙන කොට ඒවගේ ගතිගුණ තියෙන අය ක්‍රම ක්‍රමයෙන් අඩු වෙන ස්වරූපයක් තමයි අපි දකින්නේ. ඒ නිසා ජෙවාහීර් මැතිතුමාගේ අභාවය අපේ පක්ෂයට විතරක් නෙමෙයි විශේෂයෙන්ම දේශපාලන ක්ෂේත්‍රයට තිබ්ච්චි පාඩුවක් විදිහට තමයි මම දකින්නේ. එහෙම නම් මාවනැල්ල ආසනය නියෝජනය කරපු ජ්‍යෙෂ්ඨ පළාත් සභා මන්ත්‍රීවරයෙක් විදිහට එතුමා අපිට ආදර්ශයක් වුණා. අවසාන වතාවට මා සමග පහුගිය පළාත් සභා මැතිවරණයට තරඟ කළා. පළාත් සභාව ජයග්‍රහනය කරන්න නොහැකි වුණත් එතුමා මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් විදිහට තමයි අවසාන කාලයේ එතුමා ගත කළේ. ඒ නිසා එතුමාගෙන් අපිට ලැබ්ච්චි සේවය අපි හැමදාමත් සිහිපත් කරන බව මතක් කරමින් එතුමාගේ පවුලේ සියළු දෙනාටම සාතිශය සංවේගය කණගාටුව එළ කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා. මීළඟට සිරිල් පල්ලේපොල මැතිතුමා.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---

ගරු සභාපතිතුමනි,ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රීතුමියනි ජෙවාහීර් හජ්ජාර් මාවනැල්ලේ හිටපු පළාත් සභා මන්ත්‍රීතුමා පිළිබඳව කතා කරනවිට මට මතක් වෙන්නේ මගේ පුටුවේ අල්ලපු පුටුවේ වාඩි වෙලා හිටපු මහජන නියෝජිතයා මම ජෙවාහීර් හජ්ජාර් මැතිතුමා සමඟ ළඟින්ම ඇසුරු කරපු කෙනෙක් හැටියට අදහස් උදහස් මාරු කර ගත්ත මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා මුස්ළිම් ජාතිකයෙක් වුණත් කවදාකවත් සිංහල ජාතිකයෙකුට වෙනස්කමක් කරපු නැති පුංචි මහජන නියෝජිතයෙක්. දෙමළ ජනතාවට වෙනස්කමක් කරපු නැති මහජන නියෝජිතයෙක්. හැම සිංහල, මුස්ළිම්,දෙමළ භේදයකින් තොරව සේවයක් කරපු දේශපාලන නායකයෙක් හැටියට මම දැක්කා. එතුමා

මට මතකයි එතුමා මාත් සමග 99 වසරේ පළාත් සභා මැතිවරණයට ඇවිල්ලා මගේ හිතේ තුන්වෙනි පළාත් සභාවේ වාඩි වෙලා හිටියේ. එතුමා හොඳට මුස්ලිම් ජාතිකයෙක් වුණත් සිංහල වචන හොඳට පරිහරනය කරන්න පුළුවන් දක්ෂ දේශපාලඥයෙක්. එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ සෑම ආසනයකම සිංහල ගම්මාන වලට ගිහිල්ලා දුප්පත් ජනතාවට ආදාර උපකාර කරපු නායකයෙක්. මම නියෝජනය කරන දැදිගම ආසනයට ඇවිල්ලා ඒ අහිංසක දුප්පත් දරුවන්ට පොත් පත් අරන් දුන්නු දේශපාලඥයෙක්. එතුමා ඒ අතින් බොහොම ශ්‍රේෂ්ඨ නායකයෙක්. එක පැත්තකින් එතුමා දේශපාලන නායකයා වෙන්නට පෙර හොඳ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්. මහනුවර ප්‍රසිද්ධ ව්‍යාපර තිබුණා. ජේටෙක්ස් ව්‍යාපාරය තිබුණා. කොළඹ අගනුවර ජේටෙක්ස් කියන ව්‍යාපාරය පවත්වාගෙන ගියා. මං හිතන්නේ එතුමා දේශපාලනය කරන්න ගිහින් තමයි ආර්ථිකය කඩා වැටුණේ. හොරකම් කරපු නැති බොරු කියපු නැති අවංක දේශපාලඥයෙක්. එතුමා මරණ මංචකයට කිට්ටු වෙන මොහොතේ මම දැක්කා ඒ දවස්වල කතා කළා. දේශපාලඥයෝ මිය යන කොට යන්නේ හිත් තැවුලෙන්. මං හිතන්නේ මෙතුමාටත් පොඩි හිතේ අමාරු කීපයක් තිබුණා. ඒක කියන්න බෑ, එතුමා දේශපලානය කරලා තමන් ස්ව උත්සාහයෙන් ආර්ථිකය ගොඩ නගා ගෙන ඒ ආර්ථිකය විනාශ කර ගත්ත දේශපාලඥයෙක්. ඉඩ කඩම් දේපළ,ගොඩනැගිලි ,යාන වාහන ඒ සියල්ලම එතුමා දේශපාලනය වෙනුවෙන් වියදම් කළා. එක්සත් ජාතික පක්ෂය මාවනැල්ල ආසනයේ වැටිච්චි වෙලාවේ මාවනැල්ල ආසනය ගොඩ ගන්නට විශාල ශක්තියක් යෙදුවා කියන එක මම බොහොම ආඩම්බරයෙන් මතක් කරන්නේ. පක්ෂයේ නායකයා අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මාවනැල්ල ආසනයේ ශක්තියක් වුණු නායකයෙක්. කබීර් හෂීම් මැතිතුමාට පක්ෂයේ මහ ලේකම් මැතිතුමාට අපේ පක්ෂයට ශක්තියක් දුන්නු දේශපාලන නායකයෙක්. අපිට අමතක කරන්න හොඳ නෑ, අපි කියන්නේ එතුමාගේ දරුන්ට අපි කියන්නේ ජේටෙක්ස් ආයතනය ජෙවාහීර් හාජ්ජාර් මැතිතුමා කරගෙන ගිය ව්‍යාපාර ටික කරගෙන ඔබතුමන්ලාට ශක්තිය ධෛරය ලැබෙන්න කියලා මම මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා. අපි මහජන නියෝජිතයෝ හැටියට මෙතන ඇවිල්ලා එතුමා නැති වෙලාවේ ගුණ කියනවා නෙමෙයි. එතුමාගේ නම වැටෙන්නට එතුමා මාවනැල්ලේ නෙමෙයි රත්නපුර දිස්ත්‍රික්කයේ නෙමෙයි සමස්ත ශ්‍රීලංකාවේම සේවය කරපු දේශපාලඥයෙක් කියලා මම මතක් කරනවා. එහෙම නම් මම එතුමා ගැන දීර්ඝ වශයෙන් කියන්න අවශ්‍ය නෑ. මාත් එක්ක අල්ලපු පුටුවේ හිටපු මහජන නියෝජිතයා හැටියට අද ඒ පවුලේ උදවිය ඇවිල්ලා ඉන්නවා . මම දන්නවා. ඒ අයටත් ඒ පවුලේ සියළු දෙනාටත් එතුමාගේ ඥාතීන්ටත් එක්සත් ජාතීන්ටත් එක්සත් ජාතික පක්ෂයේ එතුමාත් එක්ක වැඩ කරපු ඒ සියළු දෙනාටත් එතුමා වෙනුවෙන් අපි සබරගමු පළාත් සභාවේ ශෝකය එළ කරනවා. අපි බුද්ධාගම් අය හැටියට අපි නිවන් සුව පතනවා වගේම එතුමාගේ ආගමේ අය හැටියට එතුමා පොත් පත් දෙන කොට, ළිං හදන කොට, මං මාවත් හදන කොට ස්වර්ගයට යනවා කියලයි ඒ ආගමේ කියන්නේ. එතුමාගේ ආගම අනුව ඒ පිං අයිති වෙනවා කියලා ප්‍රාර්ථනා කරමින් එතුමාට නිවන් සුව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතයි ගරු සිරිල් පල්ලේපොල මන්ත්‍රීතුමනි. මීළඟට නිහාල් ෆාරුක් ගරු මැතිතුමා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
--------------------------------------------

கௌரவ அவைத் தலைவர் அவர்களே இன்று காலஞ் சென்ற முன்னால் மாகாணசபை உறுப்பினர் அல்ஹாஜ் எஸ்.எச்.எம்.ஜெவாஹிர் அவர்களின் அனுதாப பிரேரணையை முன்வைத்து இருக்கின்ற இந்த சந்தர்ப்பத்திலே அது சம்பந்தமாக ஒரிரு வார்த்தைகளை பேசுவதற்கு சந்தர்ப்பம் வழங்கியமையை இட்டு உங்களுக்கு எனது நன்றிகளை தெரிவித்துக் கொள்கின்றேன்.கேகாலை மாவட்டத்திலே முஸ்லிம்களின் தலைவர்களுள் ஒருவராக , அரசியல் வாதியாக பிரபல வர்த்தகராக இருந்த முன்னால் மாகாணசபை உறுப்பினர் அல்ஹாஜ் எஸ்.எச்.எம்.ஜெவாஹிர் அவர்களின் மறைவு அவர்களின் குடும்பத்தினருக்கு மாத்திரம் அல்லாமல் கேகாலை மாவட்ட சிங்கள , தமிழ் , முஸ்லிம் அனைவருக்கும் அவருடைய மறைவு மிகவும் துக்ககரமானதாக இருந்தது என்பதை இந்த சபையில் கூறிக் கொள்ள விரும்புகின்றேன். ஏன் என்று சொன்னால் தன்னுடைய வியாபாரம் முழுவதையும் அரசியலுக்காகப் பயன்படுத்தி சில சந்தர்ப்பங்களிலே எமக்கு தெரியும் கடந்த 1998 ஆம் ஆண்டு நடைபெற்ற மாகாண சபை தேர்தலிலே அவர் போட்டியிட்டு அந்த தேர்தலிலே அவர் வெற்றி பெற்றதன் பின்னரும் அதற்கு முன்பில் இருந்தே அரசியலுக்கு வருவதற்கு முன்பில் இருந்தே பல சமூக சேவைகளிலே , வேலைகளிலே ஈடுபட்டவர். அரசியலை நோக்காக் கொண்டு அவர் சமூக வேலைகளிலே ஈடுபடவில்லை. அவருடைய சிறுபராயத்தில் இருந்தே அவருடைய தந்தை ஊடாக கிடைக்கப்பெற்ற அனுபவத்தின் ஊடாக சமூகத்திற்கு என்னென்ன வேலைகளை செய்ய முடியுமோ அவற்றினை தன்னால் இயன்றளவு அரசியலின் ஊடாகவும் தமக்கு இறைவனால் கிடைக்கப்பெற்ற வர்த்தகத்தின் ஊடாகவும் பல சேவைகளை செய்தவர்.எங்களுடைய உபுல் பண்டார அவர்கள் கூறியது போன்று மாவனெல்லை மயுரபாத வித்தியாலயத்திற்கு தனது சொந்த பணத்தை செலவழித்தவர். அதே போன்று மாவனெல்லை வைத்தியசாலைக்கு தனது சொந்த பணத்தை செலவழித்து பல சேவைகளைச் செய்தவர். அதே போன்று தமக்கு தன் முன்னால் வருகின்ற இயலாதவர்களுக்கு , ஏழைகளுக்கு வாரி வழங்கிய ஒரு பிரதானமான வியாபார அரசியல்வாதி. இன்று அப்படியான அரசியல்வாதிகளை காண்பதே மிகவும் அரிதாக காணப்படுகின்றது. எனவே அல்ஹாஜ் ஜெவாஹிர் ஹாஜியார் அவர்கள் நான் நினைக்கின்றேன் எமது மாவட்டத்திலே அவர் தனது அரசியலைப் பயன்படுத்தி தமது வியாபாரத்தின் மூலமாக உழைத்த பணத்தைப் பயன்படுத்தி அவரால் என்ன வேலைகளை செய்ய

முடிந்ததோ அவருக்கு இயலுமான அளவிலே பல சேவைகளைச் செய்து இருக்கின்றார். அதே போன்று எங்களுக்கு தெரியும் ஐக்கிய தேசியக் கட்சியில் இருந்து அவர் இறக்கும்வரை அவர் ஐக்கிய தேசியக் கட்சியிலே இருந்தார். பல சந்தர்ப்பங்களில் உங்களுக்கு தெரியும் பல சவால்களுக்கு முகம் கொடுத்தவர். இருந்தாலும் எந்த சவால்கள் வந்தாலும் எந்த பிரச்சினை வந்தாலும் தனது கட்சியை பணத்திற்காகவோ வேறு பதவிகளுக்காகவோ காட்டிக் கொடுக்கவில்லை.கட்சியிலே இறுதி மூச்சுவரை இருந்தார். கட்சிக்காக உழைத்தார். கட்சிக்காக செலவழித்தார். கட்சிக்காக பாடுபட்டார். எனவே அவரின் இறுதி மூச்சியும் எமது மார்க்கப்படி ரமழான் மாதத்திலே நோன்பு நோற்ற நிலையிலே தான் அவருடைய உயிர் பிரிந்தது. அது மிகவும் ஒரு நல்ல சந்தர்ப்பமாக அவருக்கு அமைந்தது. அதே போன்று ஜெவாஹிர் ஹாஜியார் அவர்கள் அரசியலில் மாத்திரமல்லாமல் சமூக சேவையிலே ஈடுபட்டவர்.அதே போன்று கட்சி இன மத பேதமில்லாமல் சகலருக்கும் உதவி புரிந்தவர். கேகாலை மாவட்டத்திலே இருக்கின்ற பெருந் தோட்டத் தொழிலாளர்களுக்கு ,தோட்டத்திற்கு அதிகமாக வேலை செய்தவர் என்பதை கூறிக் கொள்ள விரும்புகின்றேன். அதே போன்று பள்ளிவாசல்களுக்கு அதே போன்று மற்றைய விகாரைகளுக்கு தன்னால் இயன்றளவு சொந்த பணத்தைச் செலவழித்து சேவை செய்தவொரு புனித மனிதர்.எனவே இந்த சந்தர்ப்பத்திலே இப்படியானதொரு அரசியல்வாதியை இழந்தமையை இட்டு நாங்கள் கவலை அடைவதோடு எமது மார்க்கத்தின் பிரகாரம் நாங்கள் எதிர்ப்பார்ப்பது இறுதியிலே சுவர்க்கத்தை அடைவது. எனவே எல்லாம் வல்ல இறைவனின் உதவியைக் கொண்டு அவருக்கு நாங்கள் எமது மார்க்கத்தின் பிரகாரம் புனித சுவர்க்கத்தை அடைய எல்லாம் வல்ல இறைவனைப் பிரார்த்தித்துக் கொள்வதோடு இந்த சந்தர்ப்பத்திலே அவருடைய குடும்பத்தினருக்கு எமது ஆழ்ந்த அனுதாபங்களை இந்த சபையின் ஊடாக தெரிவிக்கும்படி தலைவர் அவர்களுக்கு கூறிக்கொண்டு எனது இந்த உரையை முடித்துக் கொள்கின்றேன் நன்றி.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මන්ත්‍රී යෙහෙයියා එම්.ඉෆ්ලාර් මැතිතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

---

ගරු සභාපතිතුමනි අප පළාත් සභාවේ හිටපු මගේ සහෝදර පළාත් සභා මන්ත්‍රීතුමාණන් වන අල්හාජ් එස්.එච්. එම්.ජෙවාහීර් මැතිතුමාගේ ශෝක

යෝජනාව මේ ගෞරවනීය සභාගේ ගෙන එන අවස්ථාවේ අදහස් කීපයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසාදීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තූතිවන්ත වෙන අතර සබරගමු පළාත් සභාවේ අපත් සමග කටයුතු කළ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියමින් ඒවගේම සබරගමු පළාතේ කෑගලු දිස්ත්‍රික්කයෙන් සබරගමු පළාත් සභාවට පැමිණිච්ච එවකට සබරගමු පළාතේ රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරපු මුසළිම් මන්ත්‍රීවරුන් දෙන්නාගෙන් එක්කෙනෙක් තමයි මගේ සහෝදර ජවාහීර් මන්ත්‍රීතුමා. එවකට සබරගමු පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයද විපක්ෂයේද සියළු දෙනාටම පත් වෙලා හිටියේ විපක්ෂයේ අපි දෙන්නා විතරයි පළාත් සභාව නියෝජනය කළේ. සුළු ජාතිකයා වශයෙනුත් ඒවගේම ද්‍රවිඩ මුස්ළිම් වශයෙනුත් කතා කළත් ඒ විදිහටත් ස්ළාම් ආගම අදහන අපේ සහෝදර පළාත් සභා මන්ත්‍රීතුමානන් එදා සබරගමු පළාත් සභාවෙන් රත්නපුර දිස්ත්‍රික්කයෙන් සබරගමු පළාත් සභාවට තේරී පත් වුණත් එදා කිසි දවසක තේරී පත් වුණ අවස්ථාවක කිසිම ජාතිකයෙකුට නොවී ස්වාධීනව සියළු දෙනාටම එක හා සමානව කටයුතු කරමින් එතුමා මාවනැල්ල ආසනය නියෝජනය කළත් එතුමා සමස්ත කෑගල්ල ජනතාවට සුවිශාල සේවාවන් රසක් ඉෂ්ඨ කරපු අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් තමයි ජෙවාහීර් මැතිතුමා. එතුමා අපි මේ පළාත් සභාව තුළ කටයුතු කිරීමේදී එතුමාත් මමත් මේ පළාත් සභාව නියෝජනය කළේ විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් එතුමා මේ පළාත් සභාව තුළ හඬක් නගද්දී සියළු දෙනා වෙනුවෙන් සබරගමු ජනතාවගේ අවශ්‍යතාවයන් සහ අඩුපාඩුකම් පිළිබඳව කතා කරද්දී ඉතා මැනවින් කටයුතු කරපු ඉතාමත් වැදගත් මන්ත්‍රීවරයෙක් තමයි අපේ ජෙවාහීර් හාජ්ජාර් මන්ත්‍රීතුමා. ඒවගේම තමයි ගරු සභාපතිතුමනි එතුමා අපි අතරින් වෙන් වෙන කොට එතුමා එක්සත් ජාතික පක්ෂයේ නියෝජනය කළත් එතුමා එක්සත් ජාතික පක්ෂයට සුවිශාල සේවාවන් රාශියක් ඉෂ්ඨ කරපු මන්ත්‍රීවරයෙක්. එතුමා කිසි දවසක එදා විපක්ෂය නියෝජනය කරපු දවසක මේ පළාත් සභා අරමුදල් වලින් වැඩ කරනවාට වඩා වැඩියෙන් එතුමා පුරුදු වෙලා හිටියේ තමන්ගේ පෞද්ගලිකව හම්බ කර ගත්ත දේපල වලින් තමයි එතුමා වැඩ කළේ. එතුමා ආගමානුකූලව එතුමා සටාප් කියන එකත් ඒවගේම සගදා කියන එකත් ඉතාම ඉහළින් කටයුතු කරපු පුද්ගලයෙක් තමයි මගේ මිත්‍ර ජෙවාහීර් මන්ත්‍රීතුමා. ජෙවාහීර් මන්ත්‍රීතුමා එක පැත්තකින් ස්ළාමීය ආගම අදහන ගමන් අන් ආගම් වලට ගෞරව කරමින් අන් ආගම් වලට උදව් කරමින් අන් අයත් එක්ක ඉතාම සුහදව කටයුතු කරපු නිසා තමයි එදා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් මේ සබරගමු පළාත් සභාවට සුළු ජාතිකයෙක් වශයෙන් මේ පළාත් සභාව ජයග්‍රහනය කරලා ආවේ. ඒ විතරක් නෙමෙයි එතුමා කටයුතු කරන හැම අවස්ථාවකදීම සමස්ත කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් පෙනී සිටියේ. එතුමා හැම අවස්ථාවකදීම අධ්‍යාපනය වෙනුවෙන් ආගමික සහජීවනය වෙනුවෙන් ඒවගේම ඒ ප්‍රදේශයේ ජනතාවගේ සිතුම් පැතුම් වෙනුවෙන් ඒවගේම.... අද අපි අතරින් වෙන් වුණත් ඕනෑම පුද්ගලයෙකුට මරණය නියතයි. එතුමාත් අපේ ආගමානුකූලව එතුමාගේ මරණය ඉතාම හොඳ දිනයක ඉතාම හොඳ කටයුත්තක් කරලා අපි අතරින් වෙන් වෙලා ගියා. එතුමා මම දන්නවා මම එතුමා දැකපු විදිහට එතුමා කටයුතු කරපු විදිහට ස්ළාමීය ආගමානුකූලව එතුමාට හිමි විය යුතු අපි කවුරුත් බලාපොරොත්තු වෙන ජෙන්නතුර් පිරිදොස් කියන ඒ ස්වර්ගස්ථයට යන්න පුළුවන් ඒ අවස්ථාව උදා වෙනවා. මම ප්‍රාර්ථනා කරනවා එතුමාට අපේ ආගමානුකූලව ජෙන්නතුර් පිරිදොස් කියන ස්වර්ගයට යන්නට එතුමා මේ පළාත් සභාව තුළිනුත් එතුමාගේ පෞද්ගලික ධනය තුළිනුත් එතුමා දුක් මහන්සි වෙලා හම්බ කරපු අහිංසක ජනතාව වෙනුවෙන් දන් දීලා කටයුතු කරපු මගේ සහෝදර ජෙවාහීර්

මන්ත්‍රීතුමාට අපි නැවත නැවතත් අපේ ආගමානුකූලව අවසානයේ හොඳ එතුමා මෙලොවින් සමු ගත්තා වගේම එතුමාගේ අවසාන කාලය ජෙන්නතුර් පිරිදෝස් කියන ස්වර්ගස්තයට යන්නට අවස්ථාව උදා වේවා යැයි ප්‍රාර්ථනය කරන අතර මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ කතාව අපි මේ පක්ෂ විපක්ෂ සියළු දෙනාගේම මේ අදහස් එතුමාගේ පවුලේ උදවියට ඒවගේම අපේ සබරගමු පළාත් සභාවේ ශෝකය ඒ අයට දැනුම්දීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට නැවත ස්තූතිවන්ත වෙමින් ජෙවාහීර් මැතිතුමාට අපි ප්‍රාර්ථනා කරන ස්වර්ගස්ථයට යන්න අවස්ථාව උදා වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ස්තූතියි ගරු ඉෆ්ලාර් මැතිතුමාට. මීළඟට සමිත ආටිගල මැතිතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී සමිත ආටිගල***
***கௌரவ உறுப்பினர் சமித ஆடிகல***
*Hon.Member Samitha Atigala*

---

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි 1999 අපි පළාත් සභාවට ආපු කාලයේ හඳුනා ගන්න ලැබිච්චි ප්‍රියමනාප මන්ත්‍රීවරයෙක් හැටියට තමයි ජෙවාහීර් මන්ත්‍රීතුමා අපිට හඳුන්වන්ට සිද්ධ වෙන්නේ. එතුමා දේශපාලනයට ආවේ සමාජ සේවය තුළින්. දේශපාලනයට එන්න කලින් ඒවගේම දේශපාලනය කරන කාලයේත් එතුමා සමාජ සේවය එතුමා වැදගත් කොට සැලකුවා කියන එක තමයි අපි හඳුනාගෙන තියෙන්නේ. ඒවගේම මේ පළාත් සභාව තුළිනුත් එතුමා බොහොම නිරහංකාර සාමකාමී මන්ත්‍රීවරයෙක් හැටියට අපිට ඇසුරු කරන්න අවස්ථාව ලැබුණා. ජෙවාහීර් මන්ත්‍රීතුමා අපි දන්න ආකාරයට ඉතාම සාර්ථක ව්‍යාපරිකයෙක්. අපිටත් නොයෙක් අවස්ථාවල උදව් උපකාර කරපු මන්ත්‍රීවරයෙක් හැටියට හඳුන්වන්න පුළුවන්. ඒවගේම මේ පළාත් සභාව තුළ එතුමා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන කොට එතුමාගේ අදහස මාතෘකාවට අදාලව ඉදිරිපත් කරපු වැඩිය කතා බහ නොකළ ඒවගේම කරන කතාවල් ඉතාමත් බුද්ධිමත් විදිහට මාතෘකාවට අදාලව කතා කරපු මන්ත්‍රීවරයෙක් හැටියට තමයි එතුමාව හඳුන්වන්න පුළුන්. එතුමාගේ අභාවය අපි සියළු දෙනාට පාඩුවක් කියන එක සඳහන් කරමින් එතුමාට බෞද්ධයෙක් හැටියට නිවන් සුව ලැබේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ කතාව අවසන් කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු සමිත ආටිගල මන්ත්‍රීතුමනි.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

ගරු සභාපතිතුමනි ඔබතුමා මගේ නම මතක් කරන විට මම සභාවේ නොසිටී නිසා මම අවසරයක් ඉල්ලනවා . ඒ ගරු මන්ත්‍රීතුමා පිළිබඳව වචන

කිපයක් කතා කරන්න අවස්ථාවක් ලබා දෙන්න කියලා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

අවස්ථාව ලබා දෙනවා. ගරු සභාපතිතුමනි එස්.එච්.එම්.ජෙවාහීර් හාජ්ජාර් මැතිතුමා අපිත් එක්ක පළාත් සභාවේ කාලයක් මන්ත්‍රීවරයෙක් හැටියට වැඩ කටයුතු කළා. අපේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමා මතක් කළා වගේ එතුමා පළාත් සභාවෙන් ලැබෙන මුදල් වලින් පමණක් නෙමෙයි පුද්ගලික ධනය වියදම් කරයි කියන එක එතුමා අපිට දැන ගන්නට ලැබිලා තියෙනවා. ඒ විතරක් නෙමෙයි එතුමාගේ තිබුණා ඉතාම සංවේදී අදහස් .එතුමා යම්කිසි ගමනක් ගියා නම් විදේශීය රටකට ගියා නම් ඒ විදේශීය රටේදී තමන්ගේ මේ ලංකාවට ලබලා දෙන්න පුළුවන් කාකට හරි අවස්ථාවක් තිබුණා නම් ඒ අවස්ථාව එතුමා රැගෙන ආවා. මම ඒක මතක් කරන්නේ එතුමා එක අවස්ථාවකදී ඇන්තූරියම් මල් සහ රෝස මල් විදේශගත කරන්න අවස්ථාවක් තිබෙනවා. එයා ඒ ව්‍යාපරයේ නැහැ. ඒ නිසා කවුද මේකට ඉන්නේ කියලා බලන්න ඒකට අවශ්‍ය පොතකුත් අරගෙන ආවා. මාව හම්බ වෙලා කිව්වා අජිත් මේක කරනවාද. ඔයාගේ වත්තේ මේක කරන්න පුළුවන්. මේක හොඳ මාකට් එකක්. ඒ මල් වර්ග ලබා ගන්න ආයතන ඒ සියල්ල එතුමා ගෙනල්ලා තිබුණා. අද ප්‍රේමකුමාර ගන්කන්ද මන්ත්‍රීතුමා එතුමා ඒ ව්‍යාපාරය කරනවා. ඒ මල් වගාව කරනවා. උපයෝගී කරගෙන. එතුමා බණ්ඩාරවෙල අදත් ඒ මල් ව්‍යාපාරය එතුමා ව්‍යාපාරිකයෙක් හැටියට කටයුතු කරනවා. එතුමා යම් තැනකට ගියා නම් එතුමා විෂය ක්ෂේත්‍රය නැති වුණත් යම්කිසි උදව්වක් කෙනෙකුට කරන්න පුළුවන් නම් ඒයා ඒක රැගෙන ඇවිල්ලා ඒ අවශ්‍ය පුද්ගලයාට කතා කරලා ලබලා දෙන හැටියක් ඒ ඇඟේම තිබුණා. ඒ නිසා එතුමා ඉතාම සංවේදීව කටයුතු කරපු පුද්ගලයෙක්. මම දන්නවා එතුමා දුප්පත් පවුල් වලට අවශ්‍ය කරන කුකුල් පැටව් බෙදලා දෙන ව්‍යාපාර කළා කියලා. ඒ දවස්වල අපිට උපදෙස් දුන්නා. මෙහෙම කරන්න පුළුවන්. මේ විදිහේ ව්‍යාපාර කරන්න පුළුවන්. දුප්පත් මිනිස්සුන්ට උදව් කරන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. ඒ ක්‍රමය කරන්න කියලා. ඒවගේ අදහස් තිබ්ච්චි හොඳ මන්ත්‍රීවරයෙක්. පසු පෙළේ ඉඳගෙන එතුමා සුළු ජාතිකයෙක් කියන හැඟීම එතුමා තුළ තිබුණේ නෑ. එතුමා සුභ ජාතිකයෙක් නිසා මෙතෙන්ට ආවා කියන හැඟීම තිබුණේත් නැහැ. එක්සත් ජාතික පක්ෂය කියන මහා පක්ෂය නියෝජනය කරමින් මෙතනට ආපු වැදගත් මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාට කරන්න පුළුන් හැම කාර්යය භාරයක්ම එතුමාගේ ප්‍රදේශයේ ජනතාවට පමණක් නෙමෙයි එතුමාට අත දෙන්න පුළුවන් හැම කෙනෙක් වෙනුවෙන්ම ඉෂ්ඨ කරා කියන වචන දෙක පැහැදිලිවම මතක් කරන්නට ඕනේ. ඒ නිසා අපි පාර්ථනා කරනවා එතුමා මගේ හිතේ ස්වර්ගස්ථ වුණා කියලා මුස්ළිම් ආගමේ හැටියට අපිට කියන්න තියෙන්නේ. එතුමා කරපු යම්කිසි පුණ්‍ය කර්ම වලින් එතුමා යම් අපේක්ෂාවක් කළා නම් ඒ ස්ථානයට යන්නට මේ කරන ලද කාර්යයන් පාරමිතාවක් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒවගේම මම පොඩි ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි මෙවැනි ශොක් යෝජනා සභාවට එන කොට ඒ මන්ත්‍රීවරයාගේ ඉතිහාසය පිළිබඳව තොරතුරු සභාවේ ඉන්න දැනට ඉන්න මන්ත්‍රීවරුන්ට සපයනවා නම් හොඳයි. මේක කෙරෙනවා පාර්ලිමේන්තුවේ. ඔබතුමා දන්නවා. සමහර වෙලාවට නොදන්න මන්ත්‍රීවරු ගැන අපිට කතා කරන්න වෙනවා. අපිත් එක්ක හිටපු නැති අය ගැන. හැබැයි එතුමා පිළිබඳව අපිට දැනීමක් තියෙනවා නම් අපිට පුළුවන් අපිට විශේෂ අවස්ථාවක් ලබලා දෙන්න පුළුවන් සභාව

නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් අප අතරින් වෙන් වුණා නම් ඒ පුද්ගලයා පිළිබඳව ශෝක යෝජනාව ගේන්න. අපි කවුරුත් ඒකට බැඳිලා ඉන්නවා කියන එක ඒක වගකීමක් තියෙනවා කියන එකත් අපි මතක් කරන්න ඕනේ. එහෙම නම් ඒක කරන්න සාර්ථකව එක පැහැදිලිව කරන්න ඒවගේ විස්තර ප්‍රකාශයක් හැම මන්ත්‍රීවරයෙකුටම ලබලා දෙන්න පුළුවන් නම් සභා ලේකම් කාර්යාලය හරහා ඒ අවස්ථාවල් වලදී ඒක වැදගත් වෙනවා කියන එක පිළිබඳව මම මෙ අවස්ථාවේ මතක් කරනවා. බොහොම ස්තූතියි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාට. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමා එස්.එච්.එම්.ජෙවාහීර් මැතිතුමා ඇත්තටම කියනවා නම් අපේ ඉල්ලාර් මැතිතුමා කියාපු ආකාරයට මෙතුමා ඉතාම ආදර්ශමත් මන්ත්‍රීවරයෙක් හැටියට තමයි අපි එදා ඉඳලා දැන හැඳින ගෙන හිටියේ. මෙතුමාගේ මුදලින් වාට්ටුවක් හැදුවා කිච්චහම වැටුප නොගෙන පොදු ජනතාව වෙනුවෙන් දුන්නා කිච්චහම මේවා තමයි සමාජ සේවකයෙක් මන්ත්‍රීවරයෙක් කියන්නේ ඒ අයගේ තියෙන්න ඕනේ ගතිගුණ. මේ විදිහට ගත්තහම ඒ හොඳ ගතිගුණ නිසා තමයි මුස්ලිම් ජනතාවට වැඩිය සිංහල ජනතාව මෙතුමාව පළාත් සභාවට එවන්නට කටයුතු කළේ. එහෙම නම් ඒ ගරු මන්ත්‍රීතුමා ගැන කතා කරනන දිග වේලාවක් උවමනා නැහැ. මෙතුමා අපේ හදවතේ හැමදාම රැඳිලා ඉන්න හිටපු මන්ත්‍රීතුමෙක්. මෙතුමාට අර ස්වර්ගස්ථයට යන්නට මහ පැදේවා කියා ප්‍රාර්ථනා කරමින් මගෙ මේ කෙටි වචන ස්වල්පය අවසන් කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු වික්ෂ සංවිධායකතුමාට. මීළඟට ඉඳුනිල් ශාන්ත ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී ඉඳුනිල් ශාන්ත ගුණසේන*
*கௌரவ உறுப்பினர் இதுனில் ஷாந்த குணசேன*
***Hon.Member Indunil Shantha Gunasena***

---

ගරු සභාපතිතුමනි මේ ශෝක යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ හිටපු පළාත් සභා ගරු මන්ත්‍රී එස්.එච්.එම්.ජෙවාහීර් හාජ්ජාර් මැතිතුමා මාවනැල්ල ආසනය නියෝජනය කරමින් මේ පළාත් සභාව නියෝජනය කළා. එතුමා පිළිබඳව මීට පෙර කතා කරපු ගරු මන්ත්‍රීවරු කියාපු වාගේම එතුමා ස්ලාමීය භක්තිකයෙකු වුණත් මාවනැල්ල විතරක් නෙමෙයි අරනායක ඒවගේම කෑගලු දිස්ත්‍රික්කයේම අපේ හාමුදුරුවන් වහන්සේලා සමග කිට්ටු සම්බන්ධතාවයක් තිබ්බා. ඒවාගේම සිංහල ජනතාව අතර ජනප්‍රියතාවයක් තිබුණා. එතුමා පළාත සභාවේ ඉඳලා ඊගාවට මාවනැල්ල ප්‍රාදේශීය සභාවට තරඟ කළා. මම සභාපති කාලයේත් මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. ඒ කාලය තුළත් එතුමා හැමදාම කතා

කළේ තමන්ගේ වැඩ වලට වැඩිය ජනතාවගේ ප්‍රශ්න ගැන. එතුමා හොඳ කෙනෙක් මගේ පෞද්ගලික හිතවතෙක්. මිත්‍රක්. එතුමා හදහන ආගම අනුව එතුමා මාවනැල්ල තියෙන ප්‍රධාන මුස්ලිම් පල්ලියේ දායක සභාවේ සභාපතිවරයා හැටියට විශේෂ වැඩ කොටසක් කළා මුස්ලිම් ජනතාවට. ඒවාගේම එතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල නායකයෙක්. ඒ විදිහට ඡන්දය ඉල්ලන කොට එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලුවහම මන්ත්‍රීවරයා වුණහම එතුමා සියළු දොනටම වැඩ කරපු හොඳ කෙනෙක්. ඒවාගේම එතුමා ප්‍රබලව එක්සත් ජාතික පක්ෂයට උදව් කළා. පස්සේ ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. එතුමාටත් තිබ්බා පෞද්ගලික ප්‍රශ්න කීපයක් විසදාගන්න බැරි. එතුමාගේ ගොඩනැගිලි තිබ්බා නගරයේ. ඒවේ තිබ්බා පොඩි පොඩි නීතිමය ගැටළු. එතුමා මට කිව්වා මම යූ.එන්.පී. අපේ දේශීය සභාව තිබිලත් සභාපතිතුමා මට මේ වැඩ ටික කරලා දුන්නේ නෑ කියලා. ඒවා කරන්න නීතිමය ගැටළු නෑ. නමුත් මට මේ ටික කරලා දුන්නේ නෑ මට කණගාටුයි. මම එතුමාට එන්න කියලා. ටී.ඕ.මහත්තයා ගෙන්වලා අනිත් අය ගෙන්නවලා. ඒවා නීතිමය පැත්තෙන් සියල්ලම එතුමාට මම කරලා දුන්නා. එතුමා අපේ අර මන්ත්‍රීවරු කිව්වා වගේ තමන්ගේ පෞද්ගලික මුදල් වලින් මිනිස්සුන්ට උදව් කළා. කවුරු හරි තැනි බැරි මනුස්සයෙක් ගිහිල්ලා එතුමාගෙන් ඉල්ලීමක් කළොත් මමං දන්න තරමින් ඒවා කරලා දීලා තියෙනවා. පන්සල් වලට පල්ලි වලට ඒවගේම ඉස්කෝල වලට නැති බැරි මිනිස්සුන්ට උදව් කරපු කෙනෙක්. ඒවාගේම අවසාන කාලයේ එතුමා මේ යහපාලන ආණ්ඩුවට සැහෙන්න උදව් කරපු කෙනෙක්. මිය යන්න මාස කීපයකට ඉස්සෙල්ලා මාත් එක්ක හම්බ වෙලා නගරයේදී කතා කරන කොට බොහොම කණගාටුවෙන් තමයි කතා කළේ. කළකිරීමෙන් කතා කළේ. මොකද මෙච්චර පළාත් සභා මන්ත්‍රීවරයෙක්. මෙච්චර වැඩ කරපු කෙනෙක්. එතුමාම නිසා එක්සත් ජාතික පක්ෂයට ලැබෙන ඡන්ද සංඛ්‍යාවක් තියෙනවා. එහෙම තිබිලාත් ඒ පක්ෂයෙන් සැලකුවේ නෑ කියලා බොහොම කළකිරීමකින් කතා කළේ. මම කිව්වා ඔහොම තමයි මන්ත්‍රීතුමා හැම පක්ෂයකින්ම තියෙනවා. ගණන් ගන්න එපා. කාලයක් යන කොට හරි යයි කියලා. නමුත් අකාලයේ අපි නොසිතූ මොහොතක අපි අතරින් සමු ගත්තා. එතුමා ගැන කතා කරන කොට දිගින් දිගට එතුමාගේ පුතුන් දෙදෙනා බොහොම හොඳයි. මාවනැල්ලේ නගරයේ තරුණයෝත් එක්ක එකතු වෙලා ක්‍රීඩා සමාජ පවත්වමින් සමාජයට ආදර්ශමත්ව ජීවත් වෙනවා අද නගරයේ. සියළු දෙනාගේම සැලකිලි ඇතුව. ආධාර උපකාර ඇතුව. අපිත් එක්කත් දේශපාලන පක්ෂය මොකක් වුණත් අපි කතා කළොත් හැම අවස්ථාවකම ඒ හැම අවස්ථාවකටම උදව් උපකාර කරලා තියෙනවා. ඒ නිසා එතුමා අපි අතරින් සමු ගත්තත් එතුමාගේ නම මාවනැල්ලේ ජනතාවගේ කෑගල්ලේ ජනතාවගේ මතකයේ තියෙනවා. හොඳ කෙනෙක් තමයි ජෙවාහීර් හාජ්ජාර් කියලා. එතුමාට අවසාන වශයෙන් මේ පළාත් සභාවෙන් ශෝකය ඒ පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින්. මෙලහකටත් එතුමා ස්වර්ගස්ථ වෙලා ඇති. අපි අදහන ආගම අනුව නම් දිව්‍ය ලෝකයේ යන්න ඕන කෙනෙක්. අවසානයේ අපේ ආගම අනුව නිවන් සුවය අත් වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ඉඳුනිල් ශාන්ත ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමා. ඔබතුමාට අවස්ථාව.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

---

ගරු සභාපතිතුමනි හිටපු ගරු මන්ත්‍රී එච්.එස්.එම්.ජෙවාහිර් මැතිතුමාට අපගේ ශෝකය එතුමාගේ පවුලේ සැම දෙනාට ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදීම ගැන මගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිනවා. හිටපු ගරු මන්ත්‍රීතුමා ජෙවාහිර් මැතිතුමා අපි හඳුනා ගත්තේ දේශපාලන තුළින් මේ පළාත් සභාව හරහා. ඊට පෙර දැකලා තියෙනවා. ළඟ ඇසුරක් නෑ. එතුමා අපි කවුරුත් හැඳුන්නුවා දේශපාලඥයෙක්. හොඳ ව්‍යාපරිකයෙක් කියන එක. අපි දේශපාලනය කරන්න එන්න පෙර හුඟ දෙනෙක් ඉන්නවා සාර්ථක ව්‍යාපර කරලා. ඒ ව්‍යාපාර තමන්ගේ ආගම ධර්මය අනුව ජනතාවට සේවයක් වෙන විදිහට කරලා දියුණු වෙලා ආර්ථිකය ශක්තිමත් වෙලා ඉන්න අවස්ථාවේ දාන මාන ඒවගේම දුගී දුප්පත් අයට තමන්ගේ සම්පත් බෙදා දෙන කොට යෝජනා එනවා ඔබ ඉදිරිපත් වෙන්න දේශපාලනයට ඔබ සුදුස්සෙක්. ඔබ වැදගත් මහත්මයෙක්. ඒ නිසා මේ දේශපාලනයට එන්න කියලා කියනවා. එතකොට ඒ ව්‍යාපාරික මහත්මයා මේ ඉල්ලීම් රාශියක් එන කොට ඔහු තල්ලු වෙනවා. දේශපාලනයට. හැබැයි ඒ සාධාරණ ව්‍යාපාර කරගෙන ආපු දේශපාලඥයා කවදාකවත් මේ දේශපාලනයෙන් හරි හම්බ කරගෙන යමක් කර ගන්න බලාපොරොත්තුවක් නෑ, ඔහු කරන්නේ ඔහුගේ ධනය වැය කරගෙන දේශපාලනය කරමින් සමාජයට සේවයක් කරන්න කටයුතු කිරීමයි. විශේෂයෙන් විපක්ෂයක දේශපාලනය ආරම්භ කරන කොට ගරු සභාපතිතුමනි අර මං කිව්ව පහුගිය දේශපාලනයට පෙර එන්න සේවාව කරන්න එදාටත් සිදු වෙනවා. ඒ අයට සිදු වෙන්නේ තමන්ගේ ධනය වැය කරලා ඒ ජනතාවට සේවය කරන්න. විපක්ෂයේ ඉඳලා ජනතාවට දැනෙන දෙයක් කරන්න හැකියාවක් නෑ. ඒ අනුව අපේ ගරු මන්ත්‍රීතුමා මාවනැල්ලට පමණක් සීමා වුණේ නෑ. කගලු දිස්ත්‍රික්කයටම පමණක් සීමා වුණේ නෑ. මම දන්න තරමට මහ නුවර දිස්ත්‍රික්කයටත් සේවය කළා. එයා දන්න හඳුනන තැන් වලට . පල්ලි වලට. පන්සල් වලට ඒවගේම කැගල්ල දිස්ත්‍රික්කය පුරාවට එතුමා ප්‍රකාශ කළ ආකාරයට අධ්‍යාපනයට, සෞඛ්‍යට විශාල ධනයක් වැය කළා. එතුමා ව්‍යාපාර ලෝකයේ ශ්‍රීලංකාවට සීමා වුණේ නෑ. කොළඹට, මාවනැල්ලට, නුවරට සීමා වුණේ නෑ. ජාත්‍යන්තර ව්‍යාපාරිකයෙක් හැටියට එතුමා කටයුතු කළා. එතකොට දේශපාලනය කරන කොට දේශපාලනය එදා අපේ ගරු මන්ත්‍රීතුමා කරන විට මාවනැල්ල කියන එක ගරු සභාපතිතුමා විශේෂයෙන්ම භීෂණයට මුහුණ දුන්න මන්ත්‍රීවරයෙක්. මහජන නියෝජිතයෙක්. ඔහුට අපේ උපුල් බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා කියාපු ආකාරයට මම දන්නවා එතුමාගේ නිවසේ සිටිද්දී පහර දීම වලට ලක් වෙන්න සිද්ධ වුණා. ඒවගේ දේශපාලනයට මුහුණ දුන්නේ තමුන් සාමයෙන් ඒ අනුව කටයුතු කරමින් ඔහු දේශපාලනය කළා. ඒක තමයි මහත්මා දේශපාලනය. වෛරී දේශපාලනයෙන් තොරව කුහක දේශපාලනයෙන් තොරව මහත්මා දේශපාලනයක් කරපු දේශපාලඥයෙක් තමයි අපි සිහිපත් කරන ගරු මන්ත්‍රීතුමා . ඒවගේම මම එතුමාට කියන්න කැමතියි ගරු සභාපතිතුමා ඒ ගරු මන්ත්‍රීතුමා සේවය කරන කොට තමන්ගේ ආගමේ අයට තමුන්ගේ ජාතියේ අයට කියලා සීමාවක් වුණේ නෑ. දුප්පතා කොතනද. දිළිඳු පුද්ගලයා කවුද යමක් කෙනෙක් අහිංසකයෙක් ඉල්ලලා කියන කොට කවුද ඔහු හොයා බැලුවේ නෑ මොන ජාතියේද

මොන තැනකද මොහු ඉන්නේ කියලා හොයා බැලුවේ නෑ. ඒ හැම කෙනෙකුටම අත දිග ඇරලා එතුමා ඉල්ලන දෙයක් දෙන්න බොහොම සතුටින් කටයුතු කරන්න සිදු කළා කියන එක මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. මේවගේ වැදගත් දේශපාලඥයෙක් අපි අතරින් වෙන් වෙලා තිබෙන අවස්ථාවක අද මේ ශෝකය ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබිලා තියෙනවා. අපි දන්නවා එතුමාගේ පුතණුවන් තුන්දෙනෙක් ඉන්නවා. ඒ තුන් දෙනා තමන්ගේ පියා ගිය අඩි පාරේ ව්‍යාපාර ලෝකයේ සාර්ථක කරගෙන තමුන්ගේ ආගමට අනුකූලව ජීවත් වෙලා රටේ දුගී දුප්පත් ජනතාවට කළ හැකි උපකාරයක් කරලා සමාජයේ සේවය කරලා ජනතාව අතර වැදගත් පුද්ගලයින් හැටියට ජීවත් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒවගේම අපි ප්‍රාර්ථනය කරනවා. එහෙම නම් එතුමාට එතුමාගෙ ආගමානුකූලව එතුමාට මේ වගේ සේවාවක් කරලා ලබා ගන්නා වූ යම් දෙයක් තිබේ නම් එතුමාට අපි ප්‍රාර්ථනය කරනවා එතුමා අපි අතරින් වෙන් වෙලා ගිහිල්ලා සෑහෙන කාලයක් වෙනවා. මේ වෙන කොට එතුමාගේ ආගම අනුව ස්වර්ගස්ථ වෙලා ඉන්න පුළුවන්. එතුමාට ඒ අනුව සිදු වේවා යැයි ප්‍රාර්ථනය කරමින් ඔබතුමාගේ අවසාන වශයෙන් ඉල්ලීමක් කරනවා නැවතත් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ශෝක ප්‍රකාශය ඔබතුමා රජයේ ශෝක ප්‍රකාශයත් ප්‍රකාශ කළා. ඒ අනුව ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ පවුලේ සියළු දෙනා වෙත මේ ශෝක ප්‍රකාශය යවන ලෙසට. ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
**கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக**
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තූතියි ගරු විපක්ෂනායකතුමනි. ජෙවාහීර් මැතිතුමාගේ ශෝක යෝජනාව ඒ පවුලේ පුතණුවන්ට ඒවගේම පවුලේ උදවියට යවන්න මේ අවස්ථාවේ සැබෑ දේශපාලඥයෙක් ඒවගේම සමාජ සේවකයෙක් හැටියට මගේ ශෝකය මේ අවස්ථාවේදී දරුවන් වෙනුවෙනුත් සහ ඒ පවුලේ සියළු දෙනාටම පුද කරමින් මීළඟට තේ පානය සඳහා මිනිත්තු දහයක කාලයකට සභාව කල් තබනවා.

**තේ පානයෙන් අනතුරුව නැවත සභාව ආරම්භ කරමින් ගරු උපසභාපතිතුමා මූලාසනය ගනී.**

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
**கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக**
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

තේ පානයෙන් අනතුරුව සභාව ආරම්භ කිරීම සඳහා සියළු දෙනාගේම සහාය අපේක්ෂා කරනවා.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පළාත් සභාවේ පොදු කටයුතු:**

මේ යටතේ කිසිවක් නොමැත.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු:**

කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමාගේ යේජනාව.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

---

ගරු සභාපතිතුමනි ඇත්තටම මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ විෂය භාර ගරු අමාත්‍යතුමා අද සභාවේ නෑ මේ වෙන කොට. හැබැයි අපේ සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා දූරකථනයෙන් කතා කරලා ඒ පිළිබඳව සාකච්ඡාවකට එළඹුණා. මටත් කතා කළා යෝජනාව ගන්නය කියනවා. උපරිම සහයෝගය දක්වනවා කියලා. ඉතිං මට එතුමාගේ වචනය විශ්වාස කරන්න හැකියාව තිබෙනවා. හැබැයි මේක බරපතල කාරණාවක් හැටියට තමයි මම දකින්නේ. ඒ නිසා මගේ විශ්වාසය නම් මම ඊගාව සභා වාරයට කල් තබන එක හොඳයි කියලා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ඒ නිසා ඊගාව සභාවට කල් තියනවා.

**සභාව කල් තැබීම:**

ගරු සභානායකතුමා

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

ගර සභාපතිතුමනි මෙ ගරු සභාව 2016 අගෝස්තු මස 09 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා:**

සභාව කල් තබන අවස්ථාවේ යෝජනා සඳහා අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*

---

ගරු සභාපතිතුමනි ස්තූතිවන්ත වෙනවා සභාව කල් තබන අවස්ථාවේ අවස්ථාව ලබාදීම ගැන. මගේ යෝජනාව සබරගමු විශ්ව විද්‍යාලයේ අලුතින් පිහිටවන්න බලාපොරොත්තු වෙන තාක්ෂණ විද්‍යා පීඨය සබරගමු විශ්ව විද්‍යාල භූමියෙන් පිටත එහෙම නැත්නම් රත්නපුර ප්‍රදේශයට ගේන්න යෝජනාවක් තියෙනවා. මේ යෝජනාව ඉතා බරපතලයි. මොකද අද වෙන කොට දවස් ගානක් සබරගමු විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෝ පාරට බැහැලා මේ යෝජනාවට විරෝධය පාලා සිටිනවා. ප්‍රදේශවාසීනුත් 32ප්‍රදේශයේ දේශපාලඥයෝත් සියළු දෙනාම මේ යෝජනාවට විරුද්ධයි. සබරගමු විශ්ව විද්‍යාල භූමියේ ඕන තරම් ඉඩ ප්‍රස්ථාව තියෙනවා මේ අලුත් පීඨය පටන් ගන්න. මේ තාක්ෂණ විද්‍යා පීඨය පටන් ගන්න. නමුත් යම්කිසි පාර්ශවයකින් මෙතන ඇත්තටම

කියන්නට ඕනේ දේශපාලඥයින්ගේ ඇගිලි ගැහීමක් නෑ. නමුත් විශ්ව විද්‍යාලයේ යම් යේ පාර්ශවයන්ගේ එකඟතාවය මත දුර ප්‍රශ්නය නිසා කොළඹ සිට පැමිණෙන්න තියෙන දුර ප්‍රමාණය නිසා අඩු කර ගන්න ඕනේ නිසා රත්නපුර පදේශයට ගේන්න හදන්නේ. ඒකට පෞද්ගලිකවත් මගේ පදේශයේ ජනතාවගේත් විශේෂයෙන්ම ශිෂ්‍ය සංගම් සියල්ලක්ම අද මේකට විරෝධය පානවා. එම නිසා ගරු සභාවට ඉදිරිපත් කරනවා. මේ දූක් ගැනවිල්ල. ස්තුතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමාගේ යෝජනාව.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ***
***கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ***
*Hon.Member B.Ariyawansha*

---

ගරු සභාපතිතුමනි ඒවගේම ගරු මන්ත්‍රීතුමන්ලා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසරයි. හදිසි යෝජනා යටතේ මම යෝජනා කීපයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ අනුව මේ වෙන කොට පනාමුර ප්‍රදේශයේ සිට ඇඹිලිපිටිය කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පනාමුරේ ඇත් ගාල මාර්ගය ඉතාම අබලන් තත්ත්වයේ පසු වෙන්නේ. ඒ නිසා ඒ මාර්ගය කඩිනමින් සංවර්ධනය කරලා දෙන්න කියලා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මොකද ඇත් ගාල කියන්නේ සංචාරකයින් විශාල පිරිසක් පැමිණෙන ස්ථානයක්. පසුගිය කාලයේ ඒ ඇත් ගාල සංවර්ධනය කරලා මේ දුර ප්‍රදේශවල ඉඳලා වාහන වලින් යනවා. ඒත මේ වෙන කොට ඒ ගම් වලට මේ වෙන කොට යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. එම නිසා මේ මාර්ගය කඩිනමින් සංවර්ධනය කරලා දෙන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ස්තුතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ගරු මන්ත්‍රීතුමනි ඒ යෝජනාව අපේ මාර්ග අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාටත්, ලේකම්තුමාටත් යොමු කරන්න අවශ්‍ය කටයුතු කරනවා.

දැන් වෙලාව පස්වරු 12.35 යි. මෙම සභාව 2016 අගෝස්තු මස 09 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.